අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019

# 23 - දේශපාලන විද්‍යාව - (නව නිර්දේශය)

## ලකුණු බෙදීයාම

---

**I පත්‍රය**

A සහ B යනුවෙන් කොටස් 02කි.

**I පත්‍රය A කොටස**

**කාලය පැය 02 යි**

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 30කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු 60 කි.**

**I පත්‍රය B කොටස**

කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු 40 කි.**

I පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**II පත්‍රය**

**කාලය පැය 03 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය I, II, III යනුවෙන් කොටස් 03කින් යුක්ත ය.

I වැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II වැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, III වැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ, ප්‍රශ්න 05කට පිළිතුරු ලිවිය යුතුය.

I කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 03කි.

II කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 04කි.

III කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කි.

**II පත්‍රය සඳහා මුළු ලකුණු 100 කි.**

**අවසාන ලකුණු ගණනය කිරීම:** **I පත්‍රය = 100**

**II පත්‍රය= 100**

**අවසාන ලකුණ = 200 ÷ 2 =100**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**පරීක්ෂකවරුන්ට උපදෙස් :**

මෙම සංග්‍රහය තුළ අන්තර්ගත වන්නේ අ.පො.ස. (උ.පෙළ) 2019 අගෝස්තු මාසයේදී පවත්වන ලද අංක 23 දේශපාලන විද්‍යාව විෂය නව නිර්දේශයට අයත් පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවල අඩංගු ප්‍රශ්න සඳහා පාලක පරීක්ෂක මණ්ඩලය විසින් සකස් කරන ලද ආදර්ශ පිළිතුරු මාලාව ය. මෙම පිළිතුරු සහකාර පරීක්ෂකවරුන්ට පිළිතුරු ඇගයීම සඳහා මඟ පෙන්වීමක් පමණක් වේ.

II වැනි ප්‍රශ්න පත්‍රයේ ආදර්ශ පිළිතුරුවල අඩංගු වන්නේ අසා ඇති ප්‍රශ්නයට අදාළ වන මූලික කරුණු පමණි. මෙම කරුණුවලට අමතරව, අපේක්ෂකයින් තවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම්, ඒවායේ අදාළ භාවය සැලකිල්ලට ගෙන ඒ සඳහා ද ලකුණු ලබා දීමට පරීක්ෂකවරයා ක්‍රියාකළ යුතු ය. පිළිතුරු සඳහා ලකුණු ලබා දීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි පරීක්ෂවරයා විශේෂයෙන් අවධානය යොමු කළ යුතු ය.

(අ) ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන තිබේද? හැඳින්වීම සහ ප්‍රවේශය මඟින් ඒ බව අවබෝධ කර ගත හැක.

(ආ) ප්‍රශ්නයට අදාළ කරුණු නිවැරදිව තෝරා ගෙන තිබෙනවාද සහ එම කරුණු නිවැරදිව විධිමත් අයුරින් සංවිධානය කොට ඉදිරිපත් කර තිබෙනවාද යන්න.

(ඇ) කරුණු ප්‍රමාණවත් අයුරින් විශ්ලේෂණය කර තිබෙනවාද යන්න.

(ඈ) අවසාන නිගමනයකට එළඹ තිබේද යන්න සහ එම අවසාන නිගමනය තාර්කික සහ හරවත් එකක් වනවාද යන්න.

අපේක්ෂකයින් පිළිතුරු තුළ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව යම් ගැටලු සහගත තත්වයක් පවතින්නේ නම් ඒ පිළිබඳව ප්‍රධාන පරීක්ෂකවරයාගේ අවධානයට ලක් කොට තීරණයක් ගත යුතු ය.

**ප්‍රශ්න පත්‍රවල අභිමතාර්ථ :**

**I වන ප්‍රශ්න පත්‍රය**

සමස්ත නිර්දේශ පත්‍රයම ආවරණය වන A සහ B යන කොටස් දෙකකින් යුක්තය.

A කොටසෙහි වරණ 05 බැගින් සමන්විතවන ප්‍රශ්න 30කි.

B කොටසෙහි පිළිතුරු 02 බැගින් අපේක්ෂා කරන ප්‍රශ්න 20කි.

සමස්ත නිර්දේශ පත්‍රයටම අදාළව අපේක්ෂකයන් සතු කරුණුමය දැනුම පරික්ෂා කිරීම මෙම කොටස් දෙකෙහි අරමුණයි.

**II වන ප්‍රශ්න පත්‍රය**

කොටස් 03කින් සහ ප්‍රශ්න 10කින් සමන්විතය.

I කොටස රචනා වර්ගයේ ප්‍රශ්න 03කින් සමන්විතය.

II කොටස රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 04කින් සමන්විතය.

III කොටස රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කින් සමන්විතය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

I වැනි කොටසින් දේශපාලන විද්‍යාව විෂය තුළ අන්තර්ගත වන න්‍යායන් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව සමහර ප්‍රශ්න මඟින් න්‍යායාත්මක සංකල්ප පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම ඍජුව ම පරීක්ෂාවට භාජනය කෙරෙන අතර තවත් සමහර ප්‍රශ්න මගින් තෝරාගත් රටවල් කිහිපයක් ආශ්‍රයෙන් න්‍යාය හා භාවිතය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ.

II වන කොටසේ අභිමතාර්ථය වන්නේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති යුගයේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් ක්‍රියාවට නංවන ලද සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රතිපත්ති තුළින් ඇති කරන ලද යටත්විජිත පරිවර්තනයත්, ඒ තුළ සිදු වූ දේශපාලන සහ ආණ්ඩුක්‍රමික පරිවර්තනයත් පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමයි.

III වන කොටසේ අභිමතාර්ථය වන්නේ තුලනාත්මක ආණ්ඩුක්‍රම, ජාත්‍යන්තර දේශපාලනයේ නව ගතිකත්වයන්ගේ සන්දර්භය තුළ ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳවත්, සමස්ත නිර්දේශ පත්‍රයට අදාළ තනි මාතෘකා කිහිපයක් පිළිබඳවත් අපේක්ෂකයන් සතු දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමයි.

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..........................................................
..........................................................
.......................................................... √ $\frac{4}{5}$ (△)

(ii) ..........................................................
..........................................................
.......................................................... √ $\frac{3}{5}$ (△)

(iii) ..........................................................
..........................................................
.......................................................... √ $\frac{3}{5}$ (△)

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$ (□)

www.alevelapi.com

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

www.alevelapi.com

***



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.16 / 1400 - 1600

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විතය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් පිළිතුරකට ලකුණු **දෙක** බැගින් ලකුණු **100** කි.

## A කොටස

● අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත්** ගැළපෙන පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය,
(1) රාජ්‍යය සහ ජනතාව අතර පවතින සම්බන්ධතා ක්ෂේත්‍රයකි.
(2) ආණ්ඩුවේ කටයුතුවලට පමණක් සීමා වී තිබේ.
(3) යනු රාජ්‍යය සහ ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනයයි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පමණක් සීමා වී තිබේ.
(5) ආධ්‍යාත්මික ජීවිතය කළමනාකරණය පිළිබඳ ව සැලකිලිමත් වේ. (......)

**2.** දේශපාලනය අධ්‍යයනය කිරීම,
(1) සැමවිට ම ප්‍රතිමානීය විමර්ශනයට සීමා වී ඇත.
(2) බල අරගලය හැදෑරීමට පමණක් සීමා වී ඇත.
(3) විද්‍යාත්මක විමර්ශනය පමණක් ලක්ෂණ කොට ගෙන ඇත.
(4) ස්වාභාවික විද්‍යාවන්ගේ මට්ටමට මුහුකුරා ගොස් තිබේ.
(5) විද්‍යාත්මක සහ ප්‍රතිමානීය සලකා බැලීම් දෙකෙන් සමන්විත ය. (......)

**3.** ආණ්ඩුව,
(1) වෙනස් කළ නොහැකි ආයතනයකි.
(2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවල දී මහජනතාවගේ එකම නියෝජිතයා ය.
(3) රාජ්‍යයේ මූලිකාංගයකි.
(4) රාජ්‍යය යන්නට සමාන පදයකි.
(5) රාජ්‍යයට වඩා බලවත් ය. (......)

**4.** ස්ත්‍රීවාදය,
(1) ගැහැනු ළමයින් සඳහා වෙන් වූ පාසල් තිබිය යුතු යැයි යෝජනා කරයි.
(2) සමානාත්මතාව නොතකා හරියි.
(3) ග්‍රීක යුගයේ ආරම්භ වූ මතවාදයකි.
(4) ස්ත්‍රීන් අත්විඳින, වෙනස්කොට සැලකීම් අවසන් කිරීම අපේක්ෂා කරයි.
(5) පවුලේ සුබසාධනයේ වැදගත්කම හුවා දක්වයි. (......)

**5.** ස්වාධිපත්‍යය,
(1) විශාල සහ කුඩා රාජ්‍ය අතර පවතින අසමානතා පිළිගනියි.
(2) රාජ්‍යයේ උත්තරීතර බලය සංකේතවත් කරයි.
(3) ගෝලීයකරණය නිසා අභියෝගයට ලක් වී නැත.
(4) අවශ්‍ය වූ විටෙක පහසුවෙන් බෙදිය හැකි ය.
(5) රාජ්‍යත්වය සඳහා අවශ්‍ය කොන්දේසියක් නො වේ. (......)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**6.** ඒකීය ආණ්ඩුක්‍රම ආකෘතියෙහි දී,
(1) ස්වාධිපත්‍යය බෙදා නොගනියි.
(2) ස්වාධිපත්‍යය ප්‍රාන්ත ආණ්ඩු සමග බෙදා ගැනේ.
(3) ව්‍යවස්ථාදායකයේ දෙවැනි මණ්ඩලයක් තිබීම අත්‍යවශ්‍ය ලක්ෂණයකි.
(4) මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පාලන ආයතන අතර ගැටුම් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විසඳනු ලබයි.
(5) පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදක බලය සීමිත ය. (……)

**7.** සහසංධීය ආණ්ඩුක්‍රමය
(1) ස්වාධීන රාජ්‍යයන් අතර ස්වේච්ඡා ගිවිසුමක් මත පදනම් ව නොමැත.
(2) අනෙක් ආණ්ඩුක්‍රම මාදිලිවලට වඩා කාර්යක්ෂම ය.
(3) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් සහිත ය.
(4) වර්තමාන ව්‍යවස්ථාවට පෙර ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවතිණි.
(5) තනි නීති ක්‍රමයක් සහිත ය. (……)

**8.** රාජ්‍ය ප්‍රතිපත්තිය
(1) මහජන දුක් ගැනවිලි නිරාකරණය පිළිබඳ සැලකිලිමත් නොවේ.
(2) නිලබල තන්ත්‍රයට වැදගත් භූමිකාවක් නොපවරයි.
(3) රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව ප්‍රවර්ධනය නොකරයි.
(4) මහජන ගැටලු විසඳීමේ මූලෝපාය තීරණය කරයි.
(5) දේශපාලන පක්ෂවල බලපෑමෙන් සපුරා නිදහස් ය. (……)

**9.** ජනාධිපති ආණ්ඩුක්‍රම ආකෘතිය,
(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන් මැතිවරණවලට අවකාශ සලසයි.
(2) විධායක සහ ව්‍යවස්ථාදායක බලතල ඒකාබද්ධවීමට ඉඩ සලසයි.
(3) ජනාධිපතිවරයා සලකනු ලබන්නේ විධායකයේ නාමික ප්‍රධානියා ලෙස ය.
(4) ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වග උත්තර කීමට සලස්වයි.
(5) ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය අභිබවා යාමට හැකියාව ලබා දෙයි. (……)

**10.** ගැටුම් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගැටුම් සැමවිට ම නිෂේධනීය ප්‍රතිඵල ඇති කරයි.
(2) ගැටුම් පැන නගින්නේ පාර්ශ්වකරුවන් අතර සමනය කළ නොහැකි අරමුණු නිසා ය.
(3) ගැටුම් සමාජ ජීවිතයට අදාළ නොවේ.
(4) ප්‍රචණ්ඩ ගැටුම් සහමන්ත්‍රණය මගින් පරිවර්තනය කිරීම දුෂ්කර ය.
(5) ගැටුම් සමාජය වෙනස් කිරීමට දායක නො වේ. (……)

**11.** ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයන් වන්නේ,
(1) ජාත්‍යන්තර මූල්‍ය සහ සංස්කෘතික සංවිධාන ය.
(2) බහුජාතික සමාගම් සහ රාජ්‍ය නො වන සංවිධාන ය.
(3) රාජ්‍ය ක්‍රියාධරයන් සහ රාජ්‍ය නො වන ක්‍රියාධරයන් ය.
(4) දේශපාලන පක්ෂ සහ ප්‍රභූ කණ්ඩායම් ය.
(5) ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන සහ සමාජ ව්‍යාපාර ය. (……)

**12.** සමාජවාදී මතවාදය,
(1) රාජ්‍යයේ පැවැත්ම සියලු ම සමාජ ක්‍රමවලට අවශ්‍යයැ'යි සලකයි.
(2) පෞද්ගලික දේපළ අයිතිය පිළිගනියි.
(3) ධනවාදී ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරයි.
(4) සමාජ ජීවිතය තුළ ආගමට ඇති වැදගත්කම අවධාරණය කරයි.
(5) පන්ති විරහිත සමාජ ක්‍රමයක අවශ්‍යතාව අවධාරණය කරයි. (……)

**13.** නූතන විදේශ ප්‍රතිපත්තියේ සුජාත මාධ්‍යයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) රාජ්‍ය තාන්ත්‍රික සේවාව
(2) විදේශාධාර
(3) හමුදා මූලෝපාය
(4) සංස්කෘතික සබඳතා
(5) ආගම්වලට හරවා ගැනීම (……)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**14.** ඉන්දියානු සංධීය ක්‍රමයට අදාළ **නොවන** ප්‍රකාශයක් වන්නේ මින් කුමක් ද?
(1) මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත බිහිකොට ඒවායේ නම් වෙනස් කළ හැකි ය.
(2) මධ්‍යම ආණ්ඩුවට හදිසි අවස්ථාවල දී ඒකීය ආණ්ඩුක්‍රමයක මෙන් ක්‍රියා කළ හැකි ය.
(3) මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්තවල ව්‍යවස්ථාදායක හා විධායක බලය සීමා කිරීමට හැකි ය.
(4) ඉන්දියානු සංධීය ක්‍රමය, ඇමෙරිකා එක්සත් ජනපදයේ සංධීය ක්‍රමයට සමාන ය.
(5) ව්‍යවස්ථාවේ ඒකීය මෙන් ම සංධීය ලක්ෂණ ද තිබේ. (……)

**15.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සර්වජන ඡන්ද බලය මගින් සාමාන්‍ය ජනයා සවිබල ගැන්වී ය.
(2) සුබසාධන රාජ්‍යය සඳහා පදනම දැමී ය.
(3) ස්වදේශීය දේශපාලනඥයින් වගකීම් සහගත ආණ්ඩුවක් සඳහා යොමු කළේ ය.
(4) දේශපාලනඥයින් සාමාන්‍ය ජනයා මත රඳා පැවැතීමට මග පෑදී ය.
(5) අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම පිළිබඳ මූලධර්මය හඳුන්වා දුන්නේ ය. (……)

**16.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ලිබරල්වාදීහු රාජ්‍යය සමාජයේ අපක්ෂපාත බේරුම්කරු ලෙස දකිති.
(2) ස්ත්‍රීවාදීහු රාජ්‍යය, පුරුෂාධිපත්‍ය ආයතනයක් ලෙස සලකති.
(3) ෆැසිස්ට්වාදීහු රාජ්‍යය, සමාජයට වඩා පහත් යැයි සලකති.
(4) සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු රාජ්‍යය, පොදු යහපත මූර්තිමත් කරන්නේ යැයි සලකති.
(5) මාක්ස්වාදීහු රාජ්‍යය, පාලක පන්තියේ මෙවලමක් ලෙස සලකති. (……)

**17.** ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) ශ්‍රේෂ්ඨාධිකරණය මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ඇති වන ආරවුල් නිරාකරණය කරයි.
(2) සෑම ප්‍රාන්තයක්ම සමාන බලතල භුක්ති නොවිඳියි.
(3) ශේෂ බලතල පවරා තිබෙන්නේ ප්‍රාන්තවලට ය.
(4) අධිකරණ තීන්දුවලින් මධ්‍යම ආණ්ඩුවේ බලයේ වපසරිය පුළුල් කර තිබේ.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ප්‍රාන්තවල අනුමැතිය අවශ්‍ය වේ. (……)

**18.** කෝල්බෲක්-කැමරන් කොමිසම ඉදිරිපත් කරන ලද නිර්දේශ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යැපුම් ආර්ථිකය සංරක්ෂණය කිරීම
(2) සාම්ප්‍රදායික සමාජ භාවිත වෙනස් නොකිරීම
(3) ස්වාධීන අධිකරණයක් ස්ථාපිත කිරීම
(4) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැඩවසම් ක්‍රමය භාවිත කිරීම
(5) ආණ්ඩුකාරයාගේ බලය වැඩි කිරීම (……)

**19.** 1972 ජනරජ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) එය ජනතා පරමාධිපත්‍යය පිළිබඳ සංකල්පය මත පදනම් විය.
(2) එය බලතල වෙන් කිරීමේ මූලධර්මය හඳුන්වා දුන්නේ ය.
(3) එය මූලික අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධයෙන් නෛතික ප්‍රතිකර්ම හඳුන්වා දුන්නේ ය.
(4) එය භාෂා අයිතිවාසිකම් හඳුන්වා දුන්නේ ය.
(5) එය ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටු වීය. (……)

**20.** 'නීතියේ ආධිපත්‍යය' යන සංකල්පයට අදාළ ප්‍රකාශය තෝරන්න.
(1) අත්තනෝමතික පාලනය වැළැක්වීම අරමුණු කරයි.
(2) පාලකයින්ට අභිමතානුසාරී බලය භාවිත කිරීමට ඉඩ සලසා දෙයි.
(3) පාලකයින්ට නෛතික මුක්තිය සහතික කරයි.
(4) අතීතයට බලපාන නීතිවල වලංගුභාවය පිළිගනියි.
(5) පුද්ගල අයිතිවාසිකම් සීමා කරයි. (……)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** ලිබරල් මතවාදය,

A – පුද්ගල නිදහස පිළිබඳ අදහස අවධාරණය කරයි.
B – ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් නිදහස සීමා කරයි.
C – යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ බිඳ වැටීමෙන් පසු පැන නැගිණි.
D – සීමිත ආණ්ඩුවක අවශ්‍යතාව පිළිගනියි.
E – නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයට විරුද්ධ වෙයි.

(1) ABCE (2) ABD (3) ACD (4) BCD (5) BCDE (……)

**22.** සිවිල් සමාජය,

A – රාජ්‍යයෙන් පරිබාහිරව පවතින සමාජීය පරිමණ්ඩලයයි.
B – ස්වේච්ඡා සංවිධාන ඇතුළත් වන ක්ෂේත්‍රයකි.
C – ප්‍රතිපත්ති උපදේශනයේ නියුතු වෙයි.
D – පුරවැසියන් සවිබල ගන්වයි.
E – නිර්දේශපාලනික පරිමණ්ඩලයකි.

(1) ABCD (2) ABDE (3) ACDE (4) BCD (5) BCDE (……)

**23.** දේශපාලන පක්ෂ,

A – ජනතාව ආණ්ඩුවෙන් ඈත් කරයි.
B – දේශපාලන තනතුරු සඳහා නායකයින් බඳවා ගනියි.
C – වැදගත් දේශපාලන කාරණා සම්බන්ධව ජනතාවට අධ්‍යාපනය ලබා දෙයි.
D – රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය වෙතට මහජන මතය රැගෙන යයි.
E – ආණ්ඩුකරණයේ දී ජනතාව නියෝජනය කරයි.

(1) ABCD (2) ACE (3) ADE (4) BCDE (5) BDE (……)

**24.** බලතල වෙන් කිරීම පිළිබඳ සංකල්පය,

A – ආණ්ඩුවේ බලතල සංවරණය සහ තුලනය කිරීම අවධාරණය කරයි.
B – ආණ්ඩුවේ බලය ආයතනික වශයෙන් වෙන් කිරීම අවධාරණය කරයි.
C – සාමාන්‍යයෙන් අධිකාරවාදී රාජ්‍යයන්හි භාවිතයට ගැනේ.
D – ආණ්ඩුවේ අත්තනෝමතික ක්‍රියා වැළැක්වීම අපේක්ෂා කරයි.
E – මොන්ටෙස්කියු විසින් හඳුන්වා දෙන ලදී.

(1) ABCD (2) ABDE (3) ACDE (4) BCDE (5) CDE (……)

**25.** ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයට අදාළ ලක්ෂණ තෝරන්න.

A – ස්වාධීන අධිකරණය
B – වගවීම් සහිත ආණ්ඩුකරණය
C – නීතියේ ආධිපත්‍යය
D – සක්‍රිය සිවිල් සමාජය
E – තරගකාරී නොවන මැතිවරණ

(1) ABC (2) ABCD (3) BCD (4) BCDE (5) CDE (……)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4), සහ (5) යන වරණවලින් කවර වරණයදැ'යි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | ශ්‍රී ලංකාවේ, දෙවන ජනරජ ව්‍යවස්ථාවට සිදු කළ දහනව වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා පත් කරනු ලැබේ. | පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. | (……) |
| **27.** | 1978 ව්‍යවස්ථාවේ දහඅට වන සංශෝධනය ස්වාධීන කොමිෂන් සභා දුර්වල කළේ ය. | දහ අටවන ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජනාධිපතිවරයාගේ ධූර වාර ගණන පිළිබඳ සීමා ඉවත් කෙරිණි. | (……) |
| **28.** | 1978 ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණි. | පළාත් සභා ක්‍රමය ඉන්දියානු සංඝීය ක්‍රමයට සෑම අතින්ම සමාන ය. | (……) |
| **29.** | දෙවන ජනරජ ව්‍යවස්ථාව ද්වි-මාණ්ඩලික ව්‍යවස්ථාදායක් සඳහා විධිවිධාන සැලසී ය. | දෙවන ජනරජ ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය, කණ්ඩායම් අයිතිවාසිකම් පිළිගෙන තිබේ. | (……) |
| **30.** | 1978 මුල් ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු මැතිවරණ සඳහා මනාප ක්‍රමය සමඟ සමානුපාතික නියෝජනය හඳුන්වා දුන්නේ ය. | සමානුපාතික නියෝජන ක්‍රමය, පක්ෂ නායකත්වයේ බලය වර්ධනය කළේ ය. | (……) |



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019**

**නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்**

| විෂයය අංකය பாட இலக்கம் | 23 | විෂයය பாடம் | දේශපාලන විද්‍යාව |
|---|---|---|---|

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**
**I පත්‍රය/பத்திரம் I , A කොටස**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 3 |
| 02. | 5 | 12. | 5 | 22. | 1 |
| 03. | 3 | 13. | 5 | 23. | 4 |
| 04. | 4 | 14. | 4 | 24. | 2 |
| 05. | 2 | 15. | 5 | 25. | 2 |
| 06. | 1 | 16. | 3 | 26. | 5 |
| 07. | 4 | 17. | 2 | 27. | 1 |
| 08. | 4 | 18. | 3 | 28. | 2 |
| 09. | 1 | 19. | 1 | 29. | 4 |
| 10. | 2 | 20. | 1 | 30. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :
එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## B කොටස

**31.** සංධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

- ස්වාධිපත්‍ය බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී පැවතීම.
- සාපේක්ෂ වශයෙන් ස්වායත්ත ආණ්ඩුතල දෙකක් පැවතීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වීම.
- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට හෝ පැවරීම.
- මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර ගැටලු නිරාකරණයට ශ්‍රේෂ්ඨාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් හෝ පැවතීම.
- ද්වි භේදිත (Dual), බෙදුණු, පුරවැසිභාවය/ තල දෙකක පුරවැසිභාවය පැවතීම.

**32.** සංධීය ආණ්ඩුක්‍රම බිහිවන ක්‍රම දෙකක් තිබේ. එම ක්‍රම **දෙක** නම් කරන්න.

1. ස්වාධීන රාජ්‍යයන් ලෙස වෙන්ව පැවති දේශපාලන ඒකක එකට එකතු වී සංධීය රාජ්‍යයක් පිහිටුවා ගැනීම.
2. ඒකීය රාජ්‍යයන් ලෙස පැවති රාජ්‍යයන් සංධීය රාජ්‍ය බවට පත්වීම.

**33.** ඒකීය ආණ්ඩුක්‍රමයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

- ආණ්ඩුකරණ ක්‍රියාවලියේ සංකීර්ණතා අවම වීම.
- සාපේක්ෂ වශයෙන් කාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයක් වීම.
- තීන්දු ගැනීමේ ක්‍රියාවලිය පහසු වීම.

**34.** ජනාධිපති ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර ප්‍රධාන වෙනස්කම් දෙකක් පවතී. එම වෙනස්කම් **දෙක** සඳහන් කරන්න.

- ව්‍යවස්ථාදායකය සහ විධායකය වෙන වෙනම තේරී පත්වීම.
- ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ නිල කාලය සමගාමීව අවසන් නොවීම.

**35.** යටත්විජිත ඇති කිරීමේ ක්‍රම දෙකක් පැවැත තිබේ. එම ක්‍රම **දෙක** නම් කරන්න.

- නව දේශයන් සොයාගෙන එය ජනාවාස කර මව් රාජ්‍යයේ ආධිපත්‍යයට යටත්ව එම නව දේශය පවත්වා ගැනීම.
- පෙර ජනාවාස වූ ප්‍රදේශයන් බලගතු රාජ්‍යයක් විසින් ගිවිසුමකින් හෝ යුද බලයෙන් හෝ ඈදාගෙන තම ආධිපත්‍යය යටතේ පාලනය කිරීම.

**36.** යටත්විජිත පාලකයින්ට ලංකාවේ දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට බලපෑ අභිප්‍රේරණ **දෙකක්** නම් කරන්න.

- ආරක්ෂක හා පරිපාලන වියදම් අඩුකර ගැනීම සඳහා
- ඍජුව යටත් විජිතය පාලනය කිරීම අපහසු වීම නිසා.
- යටත් විජිත මව් රාජ්‍යයේ උපරිම යහපත වෙනුවෙන් භාවිතයට ගැනීම සඳහා.
- යටත් විජිතයේ සංස්කෘතිය විජිත කාරකයාගේ අවශ්‍යතාව අනුව වෙනස් කර ගැනීමේ අවශ්‍යතාව.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**37.** පහත සඳහන් තේමා යටතේ, කෝල්බෲක්-කැමරන් කොමිසම ඉදිරිපත් කළ නිර්දේශය බැගින් සඳහන් කරන්න.

1. **අධිකරණය**
   - ඒකීය අපරාධ නීති ක්‍රමයක්/ අපරාධ විනිශ්චය ක්‍රමයක් හඳුන්වා දීම.
   - ස්වාධීන, ක්‍රමානුකූල අධිකරණයක් බිහි කිරීම.
2. **ආණ්ඩුකාරයාගේ බලතල**

   ආණ්ඩුකාරයාගේ බලතල සංවරණය කිරීම සීමා කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභා විධායක සභා පිහිටුවීම.

**38.** රාජ්‍යයක විදේශ ප්‍රතිපත්තිය තීරණය වීමට බලපාන සාධක **දෙකක්** නම් කරන්න.

- භූ දේශපාලනික පිහිටීම.
- සමාජ හා සංස්කෘතික සාධක
- දේශපාලන ආර්ථිකය
- පාලන තන්ත්‍රයේ දේශපාලන අභිලාෂ
- කලාපීය හා ජාත්‍යන්තර බල තුලනය
- ජන සමාජයේ අපේක්ෂා සහ අධිපති දෘෂ්ටීන්

**39.** දේශපාලන විද්‍යා විමර්ශනයේ සාම්ප්‍රදායික ප්‍රවේශ **දෙකක්** නම් කරන්න.

- දාර්ශනික ප්‍රවේශය
- තුලනාත්මක ප්‍රවේශය
- ඓතිහාසික ප්‍රවේශය
- ආයතනික ප්‍රවේශය
- නෛතික ප්‍රවේශය

**40.** පහත සඳහන් ප්‍රකාශනවලින් විස්තර කෙරෙන සමාජයේ ඇති දේශපාලන සංවිධාන **දෙක** නම් කරන්න.

1. **ස්වාධිපත්‍යය පිහිටා ඇති කේන්ද්‍රීය ආයතනය**

   රාජ්‍යය
2. **රාජ්‍යයේ ප්‍රධාන නියෝජිතයා**

   ආණ්ඩුව

**41.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල දේශපාලන පක්ෂ සතු කාර්යයන් **දෙකක්** නම් කරන්න.

- නියෝජනයේ ප්‍රධාන මාධ්‍යය වීම.
- දේශපාලන ප්‍රභූ ස්ථරයක් නිර්මාණය කිරීම හා එයට අලුත් කොටස් බඳවා ගැනීම.
- සමාජ කණ්ඩායම්වල දේශපාලන අරමුණු සම්පාදනය කිරීම.
- මහජන/ඡන්දදායක අභිලාෂ දේශපාලන ක්‍රියාවලිය ඇතුළට ගෙන ඒම.
- මහජනයා දේශපාලන ක්‍රියාකාරීත්වය මෙහෙයවීම සහ එයට නායකත්වය දීම.
- ආණ්ඩුවේ කටයුතු සංවිධානගත කිරීම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**42.** නූතන ජාතික රාජ්‍යයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

- එක් ජාතියකට එක් රාජ්‍යයක්ය යන සිද්ධාන්තය මත සංවිධානය වී පැවැතීම.
- රාජ්‍යයේ භෞමිකත්වය.
- නිශ්චිත දේශ සීමා තිබීම.
- රාජ්‍යය බලය මධ්‍යගත වී තිබීම.
- එක් ජාතියකට තිබිය හැක්කේ සජාතීය සංස්කෘතික සහ ජාතික අනන්‍යතාවක් යැයි සැළකීම.
- අභ්‍යන්තර සහ බාහිර ස්වාධිපත්‍යය.

**43.** සමූහාණ්ඩුවාදයේ ප්‍රධාන උපකල්පන **දෙකක්** නම් කරන්න.

- රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තේරී පත් වීම.
- මහජන පරමාධිපත්‍යය පිළිගැනීම.
- දේශපාලන වශයෙන් සක්‍රීය පුරවැසියා යන අදහස පැවතීම.
- රාජාණ්ඩුවාදයට විරුද්ධ වීම.

**44.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. ඒවායින් **දෙකක්** නම් කරන්න.

- අග්‍රාණ්ඩුකාරවරයා/ කිරීටය
- සෙනේට් සභාව/ උත්තර මන්ත්‍රී මණ්ඩලය/ ඉහළ මන්ත්‍රී මණ්ඩලය
- මහජන මන්ත්‍රී මණ්ඩලය/ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය/ පහළ මන්ත්‍රී මණ්ඩලය

**45.** රාජ්‍ය ප්‍රතිපත්ති ජීවන චක්‍රයේ ඕනෑම පියවර **දෙකක්** නම් කරන්න.

- ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර සකස් කිරීම
- ප්‍රතිපත්ති සැකසීම
- ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම
- ප්‍රතිපත්ති ඇගයීම
- ප්‍රතිපත්ති සංශෝධනය කිරීම
- ප්‍රතිපත්ති ඇවර කිරීම

**46.** රාජ්‍යයේ විකාශනය පිළිබඳ මාක්ස්වාදී න්‍යායේ ඉදිරිපත් කර ඇති ඕනෑම අවධි **දෙකක්** නම් කරන්න.

- ප්‍රාග් කොමියුනිස්ට් යුගය/ පූර්ව කොමියුනිස්ට් යුගය/ ගෝත්‍රික යුගය
- වහල් සමාජ ක්‍රමය
- වැඩවසම් සමාජ ක්‍රමය
- ධනවාදී සමාජ ක්‍රමය
- සමාජවාදී සමාජ ක්‍රමය
- කොමියුනිස්ට් සමාජ ක්‍රමය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**47.** ගැටුම් පිළිබඳ දේශපාලන වර්ගීකරණයට අයත්, ගැටුම් වර්ග **දෙකක්** නම් කරන්න.

- අන්තර් රාජ්‍ය ගැටුම්
- රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්
- රාජ්‍ය නිර්මාණ ගැටුම්

**48.** 'සීමිත ආණ්ඩුව' යන සංකල්පයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

- බලය අභිනියෝජනය කිරීම
- භාරකාරත්වය සහ කොන්දේසි සහගත බව
- සීමිත ධුර කාලය
- නීතියේ ආධිපත්‍යය
- බලතල බෙදීම
- ආණ්ඩු බලය සංවරණ සහ තුලනය

**49.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට අනුව, පළාත් සභාවක විධායකය ආයතන දෙකකින් සමන්විත ය. එම ආයතන **දෙක** නම් කරන්න.

1. ආණ්ඩුකාරවරයා
2. අමාත්‍ය මණ්ඩලය

**50.** වෙස්ට්මින්ස්ටර් මාදිලිය අනුගමනය කළ නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා **දෙකක්** නම් කරන්න.

- 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය/ සෝල්බරි ආණ්ඩු ක්‍රමය/ 1947 ආණ්ඩු ක්‍රමය/ 1947
- 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමය/ 1972 ආණ්ඩු ක්‍රමය/ 1972

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

2019.08.19 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ පළමුවැනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, තුන්වෙනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** "දේශපාලනය යනු සමාජ භාවිතයකි." පැහැදිලි කරන්න. (ලකුණු 20)

**2.** "රාජ්‍යය, සමාජයේ පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**3.** කැබිනට් ආණ්ඩුක්‍රමය සහ ජනාධිපති ආණ්ඩුක්‍රමය සංසන්දනය කරන්න. (ලකුණු 20)

## II කොටස

**4.** ශ්‍රී ලංකාවේ සිදු වූ යටත් විජිත පරිවර්තනයේ දේශපාලන පැතිකඩ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**5.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ එල්ල වූ විවේචන
(ii) විධායකයේ බලතල සහ කාර්යයන්
(iii) ව්‍යවස්ථාදායකයේ බලතල සහ කාර්යයන් (ලකුණු 10 × 2 = 20)

**6.** 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පැවැති සම්බන්ධතාව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**7.** 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ අදාළ සංශෝධනවලට සම්බන්ධ පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.
(i) රාජ්‍යයේ නායකයා වශයෙන් ජනාධිපතිගේ භූමිකාව
(ii) ව්‍යවස්ථාදායකයේ බලතල හා ඒවායේ සීමාවන්
(iii) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී අධිකරණය සතු වගකීම
(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැදගත්කම සහ එයට එල්ල වී ඇති විවේචන (ලකුණු 10 × 2 = 20)

## III කොටස

**8.** ඉන්දීය සංධීය ආණ්ඩුක්‍රම මාදිලිය අර්ධ සංධීය ක්‍රමයක් යැයි විස්තර කිරීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 20)

**9.** ලෝක දේශපාලනයේ සමකාලීන ප්‍රවණතා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

**10.** පහත සඳහන් ඕනෑම **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
(i) ජාතිකවාදය
(ii) නිරාගමිකවාදය
(iii) ගැටුම් කළමනාකරණය
(iv) "සිවිල් සමාජය" යන සංකල්පයේ අර්ථ
(v) බලය පිළිබඳ ස්ත්‍රීවාදී දැක්ම (ලකුණු 10 × 2 = 20)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**1.** "දේශපාලනය යනු සමාජ භාවිතයකි." පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

**අභිමතාර්ථය**

දේශපාලනය රාජ්‍ය හා ආණ්ඩු පාලනයට පමණක් සීමා නොවී ජනතාව ප්‍රායෝගිකව සම්බන්ධවන ක්‍රියාවලියක් බව අවබෝධ කර ගැනීම සහ පුරවැසියන්ගේ සහභාගීත්වයෙන් තොරව දේශපාලනයක් පැවතිය නොහැකි බවත් දේශපාලනය පුරවැසියාගේ භාවිතාවකි යන අදහසත් පිළිබඳව සිසුන්ගේ දැනුම සහ අවබෝධය මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතයි.

**පිළිතුරේ අන්තර්ගතය**

**හැඳින්වීම (ලකුණු 03)**

සාම්ප්‍රදායිකව දේශපාලනය යන්න තේරුම්ගනු සහ විග්‍රහ කරනු ලැබුවේ රාජ්‍යය හා ආණ්ඩුකරණය සම්බන්ධ ක්‍රියාවලියක් ලෙසය. මෙම තේරුම් ගැනීම තුළ, රාජ්‍යයෙන් පිටස්තර ක්ෂේත්‍රවල සිදුවන දේශපාලනය පිළිබඳව දේශපාලන විද්‍යාවේ විෂය පථය වෙතට ගෙන ඒමට අවකාශයක් නොවීය. එබැවින්, දේශපාලනය පිළිබඳ වඩාත් සමකාලීන ප්‍රවේශය මගින් ඉස්මතු වන්නේ, රාජ්‍යය පිළිබඳ ක්ෂේත්‍රය දේශපාලනයට වැදගත් වන අතරම, දේශපාලනය යන්න රාජ්‍යයෙන් බැහැර ක්ෂේත්‍රවල ද සිදුවන බවයි. ඒ අනුව දේශපාලනය රාජ්‍ය බලය සම්බන්ධ බල අරගලවලට පමණක් සීමා නොකර, සමාජය තුළ විවිධ ආකාරවලින් සිදුවන සමාජ භාවිතාවක් ලෙස ද දැකිය හැකිය.

**සාකච්ඡාව (ලකුණු 14)**

- ''දේශපාලනය යනු සමාජ භාවිතාවකි'' යන ප්‍රකාශයේ ඇති අර්ථයක් නම්, දේශපාලනය යනු වෘත්තීය දේශපාලනඥයින්ට පමණක් අයත් වෘත්තියක් නොවේය යන්නයි: එය සාමාන්‍ය ජනතාව වන පුරවැසියන් ද නිතිපතා යෙදෙන භාවිතයකි.
- ඉහත දැක්වූ අර්ථයට අනුව, පුරවැසියෝ දෛනිකව දේශපාලනයේ යෙදෙති. ඔවුහු මැතිවරණවලදී ඡන්දය දෙති. දේශපාලන පක්ෂවලට බැඳී දේශපාලන කටයුතුවල යෙදෙති. පක්ෂ රැස්වීම්වල සහ ඡන්ද ව්‍යාපාරවල යෙදෙති. විරෝධතා ව්‍යාපාරවලට සහභාගි වෙති. ඒ අතර ඔවුහු තම හිතවතුන්, අසල්වැසියන් සමග දේශපාලනය සාකච්ඡා කරමින් දේශපාලන සන්නිවේදනයේද යෙදෙති. දේශපාලන පුවත් හුවමාරු කර ගනිති. මේ මගින් පුරවැසියන් අතර ඇති දේශපාලන අවබෝධය සහ විඥානයත්, දේශපාලන විමසිලිමත් බවත් ගොඩ නගති.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- ඡන්දය දීම යනු පුරවැසියන් සිදුකරන ඉතාම වැදගත් දේශපාලන ක්‍රියාවයි. එය වනාහී ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ඇති දේශපාලන භාවිතාවකි.
- ඡන්දය දීම යනු සමාජමය ක්‍රියාවක් ද වෙයි. ඡන්දය දීම මගින් පුරවැසියෝ තීරණාත්මක කාර්යයන් දෙකක් සිදු කරති. පළමුව, තමන්ද, තමන් සාමාජිකයන් වන සමාජයද ආණ්ඩු කරන පාලකයින් තෝරා පත් කරති. දෙවනුව, ඔවුන්ට බලය පවරති. පළමුවැන්න පුරවැසියන්ගේ දේශපාලන කාර්යයේ ඇති වරණීය වගකීමයි. දෙවැන්න බලය පැවරීමේ වගකීමයි.
- පුරවැසියන්ට රාජ්‍යය සමග සාමාන්‍යයෙන් ඇත්තේ වක්‍ර සම්බන්ධයකි. රාජ්‍යය සමග සෘජු සම්බන්ධතා පවත්වන්නේ වෘත්තීය දේශපාලනඥයින් සහ රාජ්‍ය නිලධාරීන්ය.
- රාජ්‍යයට බාහිරව, සිවිල් සමාජයේ දේශපාලනය කිරීම මගින් ද පුරවැසියෝ දේශපාලනයේ යෙදෙති. ඒ සිවිල් සමාජ ක්ෂේත්‍රයේ දේශපාලනයයි.
- සිවිල් සමාජය යනු පුරවැසියන්ට අන්‍යොන්‍ය සුභසාධනය සහ සාමූහික උවමනාකම් සාක්ෂාත් කරගැනීම සඳහා පුරවැසි සංවිධාන පිහිටුවා ගැනීමට ඇති සමාජමය අවකාශයයි. සුභසාධක සහ සමාජ සේවා අරමුණු සඳහා ඇති ස්වේච්ඡා සමිති, ආගමික, සංස්කෘතික ආදී සංවිධාන ඒවාට අයත් වේ.
- මෙම සිවිල් සමාජ සංවිධානවල ද පුරවැසියෝ ක්ෂුද්‍ර සහ බිම් මට්ටමේ දේශපාලනයේ යෙදෙති. පුරවැසියන් සක්‍රීය පුරවැසියන් වන්නේ ඒ මගිනි. එම සංවිධානවල ක්‍රියාත්මක වීම තුළින් පුරවැසියෝ ප්‍රජාතන්ත්‍රවාදය ද ඉගෙන ගනිති. ග්‍රාමීය සහ බිම් මට්ටමෙන් ඇති පුරවැසි සහ සිවිල් සමාජ සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් පුහුණු කරන පුහුණු පාසැල් ය.
- රාජ්‍යයෙන් පරිබාහිරව සිවිල් සමාජයේ සිදුවන පුරවැසි දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ නිදසුන් ගැන ද මෙහි දී සඳහන් කළ හැකිය.
- මෙම සාකච්ඡාව ස්ත්‍රීවාදය වැනි දේශපාලන න්‍යාය සමග ද සම්බන්ධ කළ හැකිය.

**නිගමනය (ලකුණු 03)**

ඉහත සාකච්ඡාව සාරාංශ කරමින් දේශපාලනය යනු රාජ්‍යය, ආණ්ඩුව සහ රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍රවලට පමණක් මෙන්ම රාජ්‍ය පාලකයින් සහ වෘත්තීය දේශපාලනඥයින්ට පමණක් ද සීමා නොවී සමාජයේ සාමාන්‍ය පුරවැසියන්ද සහභාගි වන සමාජ භාවිතාවක් ලෙස හැඳින්විය හැකි බව නිගමනය කළ හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**2.** "රාජ්‍යය, සමාජයේ පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි." සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

**අභිමතාර්ථය**

මේ ප්‍රශ්නයේ අරමුණ, දේශපාලන න්‍යාය ආශ්‍රයෙනුත්, සමාජයේ සාමාජිකයන් වශයෙන් තමන්ගේම අත්දැකීම් සහ නිරීක්ෂණද ආශ්‍රයෙන් රාජ්‍යය පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 03)**

රාජ්‍යය යනු මනුෂ්‍ය සමාජයේ ඇති පැරණිතම සමාජ ආයතනයක් බවත්, එය දේශපාලන න්‍යායේ, දර්ශනවාදයේ සහ විග්‍රහයේ ප්‍රධාන තේමාවක් බවත් සඳහන් කිරීමෙන් පිළිතුර ආරම්භ කළ හැකිය. එසේ වුවත්, අනෙකුත් සමාජ ආයතන සමග සසඳන විට රාජ්‍යයේ සුවිශේෂතාවක් තිබේ. එය නම්, රාජ්‍යය ''දේශපාලන බලය'' සමග සුවිශේෂ සම්බන්ධතාවක් ඇති සමාජ ආයතනයක් වීමයි. කිසිදු නූතන සමාජයකට රාජ්‍යයක් නොමැතිව පැවතිය නොහැකිය. එය දේශපාලනය කැටි කර ගෙන, එය සංකේතවත් කරන සහ ප්‍රකාශයට පත් කරන මූලික සමාජ ආයතනයයි.

මෙම පිළිතුරෙන් ඉදිරිපත් කරන සාකච්ඡාව කොටස් දෙකක් මත ගොඩ නැගිය හැකිය.

i. සමාජ ආයතනයක් ලෙස රාජ්‍යයේ ඇති සුවිශේෂීත්වය කුමක්ද?
ii. එය දේශපාලන චින්තනයේ/න්‍යායේ පැහැදිළි කර තිබෙන්නේ කෙසේද?

**සාකච්ඡාව (ලකුණු 14)**

**රාජ්‍යයේ ඇති විශේෂත්වය කුමක්ද?**

**එම විශේෂත්වය ගැන දේශපාලන චින්තනය/ න්‍යාය පැහැදිලි කරන ආකාරය (ලකුණු 03)**

**i. සමාජ ආයතනයක් ලෙස රාජ්‍යයේ ඇති සුවිශේෂීත්වය කුමක්ද?**

- සෑම සමාජයකම, එහි සාමාජිකයින් පාලනය කිරීමේ අරමුණ සහිත දේශපාලන ආයතන තිබේ. පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය, රාජ්‍ය පරිපාලනය සහ නිලධර තන්ත්‍රය, පොලිසිය සහ සන්නද්ධ හමුදා, පලාත් පාලනය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යන මේවා නිදසුන් ය.
- සමාජය පාලනය කිරිමේ එම අරමුණ සඳහා නීති සම්පාදනය, ඒවා ක්‍රියාත්මක කිරිම, යුක්තිය පසිඳලිම, තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම, පුරවැසියන් කීකරු කිරීම, ආර්ථිකය මෙහෙයවීම, පුරවැසියන්ගේ යහ පැවැත්ම සහ සුභසාධනය සහ අනෙකුත් සමාජ සහ රටවල් සමග සබඳතා පැවැත්වීම යන කාර්යයන් කළ යුතුව තිබේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- සමාජය පාලනය කිරීමේ ඉහත කී ආකාරයේ ආයතන ඉටු කරන කාර්යයන්, දේශපාලන විද්‍යාවේ හඳුන්වනු ලබන්නේ, නීති සම්පාදක, විධායක, අධිකරණ, පරිපාලන සහ ආරක්ෂක යන කාර්යයන් ලෙසය. මේ අනුව, මෙම කාර්යය භාරයන් ඉටුකිරීම සඳහා වෙන්වූ ආණ්ඩුකරණ ආයතන තිබේ.
- ඒවා ආණ්ඩුකරණ ආයතන ලෙස සමාජයේ ක්‍රියාත්මක වන විට, ඒවායේ සමස්තය, විසින් තවත් විශාල ආයතනයක් නිර්මාණය කරනු ලැබේ. අප එය හඳුන්වන්නේ ''රාජ්‍යය'' නමිනි.
- එසේ නම්, රාජ්‍යය යනු කුමක්ද? එය වූ කලී අප ඉහත සඳහන් කළ ආණ්ඩුකරණ ආයතනවල අවසාන ඓක්‍යයයි. ඒවා සාමුහිකව අත්පත් කර ගන්නා අවසාන ආයතනික ස්වරූපයයි. මෙහිදී, ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ, පරිපාලන ආයතන, ආරක්ෂක හමුදා යන මේවා රාජ්‍යයේ ආයතනික ශාඛා ලෙස සැලකේ. මේ නිරීක්ෂණය මගින් අපට රාජ්‍යය යනු සමාජයේ ඇති දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයක් යන ප්‍රකාශයේ පළමුවන අර්ථය ලැබේ.
- ඉහත කී ආයතන ආණ්ඩුකරණ ආයතන ලෙස අප සළකන්නේ නම්, ඒවාට තම කටයුතු කිරීමට අවශ්‍ය බලය සහ අධිකාරය සපයන මූලාශ්‍රයක් තිබිය යුතුය. එම අධිකාර බලය නොමැතිව එම ආයතනවලට පැවතිමට හෝ ක්‍රියාත්මක වීමට නොහැකියි. හේතුව, එසේ නොවේ නම්, ඒවායේ නියෝග මහජනතාව පිළිනොගැනීමයි.
- මේ ප්‍රශ්නයට ඇති පිළිතුර නම් එම ආයතන තම අධිකාර බලය ලබාගත්තේ රාජ්‍යයෙන්ය යන්නයි. මන්දයත් (අ) ඒවා රාජ්‍යයේම ආයතනික ශාඛාවන්ය. (ආ) ඒවායින් ප්‍රකාශවන්නේ රාජ්‍යයේම කැමැත්ත සහ අධිෂ්ඨානයයි. මෙය වනාහී, 'රාජ්‍යය යනු සමාජයේ පවතින දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනය වේ' යන ප්‍රකාශයේ ඇති දෙවැනි අර්ථයයි.
- එම ආණ්ඩුකරණ ආයතන, සමාජය තුළ රාජ්‍යය වෙනුවෙන් නියෝජනය කරන සුවිශේෂ බලය කුමක්ද? ඒ සඳහා දේශපාලන විද්‍යාවේ විශේෂ සංකල්පයක් තිබේ. එය නම් ''පරමාධිපත්‍යය'' යන්නයි. පරමාධිපත්‍යය යනු සමාජය තුළ රාජ්‍යයට පමණක් හිමි බලයකැයි සැළකේ. සමාජයේ අන් කිසිදු ආයතනයකට මේ බලය තමන් සතුව ඇතැයි කිව නොහැකිය. ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායට අනුව රාජ්‍යයේ පරමාධිපත්‍ය බලය යනු මහජනතාව සතු බලයයි. එම බලයෙන් ප්‍රකාශවන්නේ, තම තමන් පාලනය කර ගැනීම සඳහා මහජනතාව සතු කැමැත්ත සහ අධිෂ්ඨානයයි.
- රාජ්‍යයේ පරමාධිපත්‍ය බලයට අප ඉහත දී හඳුනාගත් ආණ්ඩුකරණ කර්තව්‍යයන් අයත් වේ. එම එක් එක් ආයතනයක් හිමි කර ගත්තේත්, ක්‍රියාත්මක කරන්නේ රාජ්‍යයේ එම පරමාධිපත්‍ය බලයේ එක් අංගයක් පමණි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- ඒ අනුව රාජ්‍යය යනු, ජනතාවගේ පරමාධිපත්‍ය බලයේ සියළු පැතිමාන අවසානයේ දී නියෝජනය කරන ආයතනයයි. පුරවැසියන් ලෙස රාජ්‍යයේ එම බලයට අපි දිනපතාම අවනත වෙමු. සමාජයේ අන් සියලු පුද්ගලයින් හා ආයතනද රාජ්‍යයේ එම බලයට අවනත වෙති. එම බලය අප සාමාන්‍යයෙන් ප්‍රශ්න කරන්නේ නැත. එය උල්ලංඝණය කරන්නේ නම් අපට රාජ්‍යය ඇතුළත පැවතිය නොහැකිය. තම අභිප්‍රායයට පුරවැසියන් හා සමාජ ආයතන අවනත කිරීමේ අධිකාර බලය, ආයතන සහ පිරිස් බලයද රාජ්‍යයට තිබේ.
- මෙලෙස පුරවැසියන් සහ ආයතන මත රාජ්‍යය සතු බලය පරිපූර්ණ බලයකි.

**ii. රාජ්‍යයේ ඇති මෙම විශේෂත්වය දේශපාලන චින්තනය/න්‍යාය පැහැදිළි කරන ආකාරය**

රාජ්‍යයේ ඇති මෙම විශේෂත්වය, දේශපාලන න්‍යායයේ විවිධාකාරයෙන් විග්‍රහ කෙරේ. ඒ සෑම එකකින්ම කියවෙන්නේ රාජ්‍යය යනු සමාජයේ ඇති දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනය බවයි.

මේ පිළිතුර පිළිබඳව දේශපාලන චින්තනයේ සහ න්‍යායේ ඇති සම්ප්‍රදාය හයක් අපට හඳුනාගත හැක.

1. ඇරිස්ටෝටලියානු පිළිතුර
   රාජ්‍යය යනු සමාජයේ ඇති උත්තරීතර මනුෂ්‍ය සමාගම යැයි ඇරිස්ටෝටල් දේශපාලනය යන සුප්‍රසිද්ධ කෘතිය ආරම්භයේදීම කියයි. එහෙත් එය අන්‍ය සමාගම්වලට වඩා උත්තරීතර වන්නේ, එහි සෑම වැසියෙකුගේම සුභසාධනය සහ යහපැවැත්ම තම අරමුණ කරගන්නා නිසා යැයි ඇරිස්ටෝටල් කියා සිටියේය.
2. දෙවැනි පිළිතුර අපට ලැබෙන්නේ, සම්භාව්‍ය ඉන්දියාවේ සිටි දේශපාලන චින්තකයෙකු වූ කෞටිල්‍යගෙනි. අර්ථශාස්ත්‍රය නම් කෘතියේ ඔහු ඉදිරිපත් කළ ප්‍රවාදය නම්, රාජ්‍යයට සමාජයේ සෑම කෙනෙකුම අවනත කර ගැනීමට හැකියාව ලබා දෙන සුවිශේෂී බලයක් ඇති බවයි. එම බලය නම්, දඬුවම් පැණවීමේ බලයයි. ඔහු එය හැඳින්වූයේ ''දණ්ඩ'' යනුවෙනි.
3. තෙවැනි පිළිතුර අපට ලැබෙන්නේ තෝමස් හොබ්ස් ඉදිරිපත් කළ සමාජ සම්මුතිවාදී න්‍යායෙනි. මනුෂ්‍යයන් රාජ්‍යයක් නිර්මාණය කළේත්, රාජ්‍යයේ බලය පිළිගන්නේත්, එයට අවනතවන්නේත්, තමන්ට අවශ්‍ය ආරක්ෂාව සහ රැකවරණය ලැබෙන්නේ රාජ්‍යය වෙතින් පමණක් නිසාය. රාජ්‍යය නොමැති



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

තැන පවතින්නේ අරාජිකත්වයයි. එනම් ප්‍රචණ්ඩත්වය, ව්‍යාකුලත්වය, පුද්ගල ආත්මාර්ථකාමීත්වය සහ අවනීතියයි, ඒ වෙනුවට පුද්ගල ආරක්ෂාව සහ සමාජ ස්ථායීතාව ලබා දෙන්නේ රාජ්‍යයයි.

4. ලිබරල් දේශපාලන සම්ප්‍රදායේ ජෝන් ලොක් වෙතින් අපට තවත් පිළිතුරක් ලැබේ. ඒ අනුව රාජ්‍යයේ පරමාධිපත්‍යය යනු මහජනතාව සතු බලය මහජනතාව විසින් පාලකයින්ට සිය කැමැත්තෙන් පැවරීමෙන් ලැබුණු කොන්දේසි සහගත බලයකි. මනුෂ්‍යයන් රාජ්‍ය බලයට අවනත වන්නේ, සිය කැමැත්තෙනි. මන්දයත්, පුරවැසියන්ගේ ජීවිතය හා නිදහස ආරක්ෂා කිරීම රාජ්‍යයේ මූලික යුතුකම සහ වගකීම වන හෙයිනි.
5. කාල් මාක්ස් මීට වඩා හාත් පසින්ම වෙනස් විග්‍රහයක් රාජ්‍ය බලය පිළිබඳව ඉදිරිපත් කළේය. මාක්ස්වාදී න්‍යායට අනුව රාජ්‍යය යනු සමාජයේ අධිපති පාලක පන්තියේ පන්ති ආධිපත්‍යයේ ආයතනයයි. එය සතුව ඇත්තේ පීඩිත පන්තීන් මත පාලක පන්තියේ බලය පවත්වා ගැනීමේ බලහත්කාරී හා මර්දනකාරී බලයකි. පුරවැසියන් රාජ්‍ය බලයට අවනත වන්නේ, ලිබරල්වාදීන් කී ආකාරයට සිය කැමැත්තෙන් නොව අකමැත්තෙනි. රාජ්‍යය බලය සමාජය පුරා මර්දනකාරී, බලහත්කාරී බලයක් ලෙස පවතින හෙයිනි.
6. මාක්ස්ගේ අදහසට තරමක් සමාන අදහසක් ඉදිරිපත් කරමින්, ජර්මන් සමාජ විද්‍යාඥයෙකු වූ මැක්ස් වේබර් කියා සිටියේ රාජ්‍යයේ ඇති විශේෂත්වය නම් සමාජය තුළ ප්‍රචණ්ඩ, බලහත්කාරී බලය සුජාත ලෙස භාවිතා කිරීමේ ඒකාධිකාරය ඇත්තේ තමන්ට පමණක් බවයි. එය අන්‍ය මනුෂ්‍ය සමාගම් සතුව නැති ලක්ෂණයක් බව ද වේබර් පෙන්වා දුන්නේය. තම අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍යයේ සීමා තුළ සිටින අන් කිසිදු සමාගමකට මෙම බලය හිමි නැත.

www.alevelapi.com

**නිගමනය (ලකුණු 03)**

ඉහත සාකච්ඡාවෙන් පෙනෙන පරිදි රාජ්‍යය සමාජයේ පවත්නා මනුෂ්‍ය සමාගමක් වුව ද, අන් සියලු සමාගම්වලට නැති විශේෂත්වයක් රාජ්‍යයට තිබේ. රාජ්‍යයේ දේශසීමා ඇතුළත සිටින සියලුම දෙනා සහ ආයතන තම අධිකාර බලයට අවනත විය යුතුය යන රාජ්‍යයේ අපේක්ෂාව එම විශේෂත්වයයි. එවැනි අවනතවීමක්, ඇත්ත වශයෙන්ම සිදුවෙයි. තමන් වෙත ඇති එම අවශ්‍යතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය බලය, අධිකාරය, නීති රෙගුලාසි, ආයතන සහ පිරිස් බලයද රාජ්‍යයට තිබේ. රාජ්‍යයේ එම බලය වූ කලී සමාජය තුළ සංවිධානය වී තිබෙන දේශපාලන බලයයි. මෙලෙස රාජ්‍යය යනු සමාජයේ පවතින සංවිධිත දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනය වෙයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**3.** කැබිනට් ආණ්ඩුක්‍රමය සහ ජනාධිපති ආණ්ඩුක්‍රමය සංසන්දනය කරන්න.

**(ලකුණු 20)**

**අභිමතාර්ථය**

විධායක බලය ක්‍රියාත්මක වීම අනුව ආණ්ඩුක්‍රම ආකෘතීන් දෙකක් වන කැබිනට් ආණ්ඩුක්‍රමය හා ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ස්වභාවය හා ලක්ෂණ එහි යහපත් අයහපත් ලක්ෂණ පිළිබඳව අපේක්ෂකයාගේ සංසන්දනාත්මක දැනුම හා අවබෝධය මැන බැලීම මෙම මාතෘකාවෙන් අපේක්ෂිතය.

**හැඳින්වීම (ලකුණු 03)**

- ලෝකයේ ක්‍රියාත්මක වන ජනප්‍රියතම ආණ්ඩුක්‍රම ආකෘතීන් දෙකක් ලෙස ජනාධිපති හා කැබිනට් ආණ්ඩුක්‍රම හැඳින්විය හැකිය. විධායක බලය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ආණ්ඩුක්‍රමයක් කැබිනට් ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්වේ.

  නිදර්ශන - බ්‍රිතාන්‍ය, ඉන්දීය ආණ්ඩුක්‍රමය.

- විධායක බලතල ජනාධිපතිවරයෙකු වටා කේන්ද්‍රගත කොට ඇති ආණ්ඩුක්‍රමයක් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්වේ.

  නිදර්ශන - ඇමෙරිකා එක්සත් ජනපදය

  කැබිනට් ආණ්ඩු ක්‍රමය අයත් වන්නේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම සම්ප්‍රදායටය. බ්‍රිතාන්‍යය ඒ සඳහා ඇති සම්භාව්‍ය නිදසුනයි.

**සාකච්ඡාව (ලකුණු 14)**

කැබිනට් ආණ්ඩුක්‍රමයේ හා ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ස්වභාවය පිළිබඳව පහත දැක්වෙන පරිදි සංසන්දනය කළ හැකිය.

- කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය ද්විත්ව ස්වරූපයක් ගන්නා අතර ජනාධිපති ආණ්ඩුක්‍රමයක එය ඒකීය ස්වභාවයක් ගනී. කැබිනට් ආණ්ඩුක්‍රමයක, කිරීටය හෝ ජනාධිපතිවරයා නාමික විධායකයේ ප්‍රධානියා වන අතර, සැබෑ නැතහොත් තථ්‍ය විධායකයේ ප්‍රධානියා අගමැතිවරයාය. අග්‍රාමාත්‍යවරයා දේශපාලන විධායකයේ ප්‍රධානියාය. ජනාධිපති ක්‍රමයක විධායකය නාමික සහ සැබෑ නැතහොත් දේශපාලන වශයෙන් විධායකය බෙදී නැත. ජනාධිපතිවරයා ඒකාබද්ධ විධායකයේ ප්‍රධානියාය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය ව්‍යවස්ථාදායකය තුළින් ව්‍යුත්පන්න වන අතර ජනාධිපති ආණ්ඩුක්‍රමයකදී එය ව්‍යවස්ථාදායකයට පරිබාහිරව වෙනම ජනාධිපතිවරණයකින් තේරී පත්වේ.
- කැබිනට් ආණ්ඩුක්‍රමය සාමාන්‍යයෙන් පවතින්නේ පාර්ලිමේන්තු ක්‍රමවලය.
- කැබිනට් ආණ්ඩුක්‍රමයේ විධායකය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීමට බැඳී සිටී. ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයකට සෘජුව වගකීමට බැඳී නැති අතර මහජනතාවට සෘජුව වගකියනු ලැබේ. ජනාධිපති ක්‍රමයක ජනාධිපතිවරයා සෘජුවම මහජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබෙන අතර, ඒ නිසාම මහජනතාවට වගකිව යුතුය. මෙය සමූහාණ්ඩුවාදී මූලධර්මයක් ද වෙයි.
- ජනාධිපති ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකයේ නිල කාලය හා ජනාධිපතිගේ නිල කාලය එක්ව අවසන් නොවේ. එහෙත් කැබිනට් ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකයේ නිල කාලය අවසන් වීම විධායකයේ නිල කාලය අවසන් වීමට හේතු වේ.
- කැබිනට් ආණ්ඩුක්‍රමයක දේශපාලන පක්ෂග්‍රාහි කාරණා පදනම් කොටගෙන විධායකය ඉවත් කිරීම පහසුය.

  උදා-: අයවැය පරාජය කිරීම, රාජාසන කතාව පරාජය කිරීම, විශ්වාසභංග යෝජනාවක් හෝ වැදගත් පනතක් පරාජයට පත්කිරීම මගින් විධායකය ඉවත් කළ හැකිය.

  එහෙත් ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා ඉවත් කිරීමට ප්‍රතිපත්ති කාරණා මත පදනම් වී දෝෂාභියෝග යෝජනාවක් සම්මත කළ යුතුය. එය සරල බහුතරයක් ඉටුකළ නොහැකි, දුෂ්කර ක්‍රියාදාමයක් ද වේ.
- ජනාධිපති ආණ්ඩුක්‍රමයක දේශපාලන ස්ථාවරභාවය වැඩි ය. කැබිනට් ආණ්ඩුක්‍රමයක දේශපාලන ස්ථාවරභාවය අඩු ය.
- කැබිනට් ආණ්ඩුක්‍රමය ප්‍රජාතන්ත්‍රීයභාවය අතින් ඉහළය. ජනාධිපති ආණ්ඩුක්‍රමවල ඊට සාපේක්ෂව ඒකාධිපති ස්වභාවයක් ගැනිමට ප්‍රවණතාවක් තිබේ.
- ජනාධිපති ආණ්ඩුක්‍රමය විධායකයේ පැවැත්ම ව්‍යවස්ථාදායකය මත රඳා නොපවතින නිසා කාර්යක්ෂමතාවෙන් වැඩිවන අතර, කැබිනට් ආණ්ඩුක්‍රමය ඊට සාපේක්ෂව කාර්යක්ෂමතාවයෙන් අඩු ය යන විවේචනය ද කැබිනට් ආණ්ඩුක්‍රමය පිළිබඳව එල්ල වි තිබේ.
- කැබිනට් ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකය උත්තරීතර තත්ත්වයට පත්වන අතර ජනාධිපති ආණ්ඩුක්‍රමයක එවැනි තත්ත්වයක් ඇති නොවේ.
- ජනාධිපති ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ගැටුම් ඇති වීමට ඉඩ ඇති අතර කැබිනට් ආණ්ඩුක්‍රමයක එවැනි තත්ත්වයක් ඇති වීමට ඇති ඉඩකඩ සීමිතය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- ජනාධිපති ආණ්ඩුක්‍රමයක රාජ්‍ය නායකයාගේ භූමිකාව සහ ආණ්ඩුවේ නායකයාගේ භූමිකාව ජනාධිපතිවරයා විසින් උසුලනු ලැබුව ද කැබිනට් ආණ්ඩුක්‍රමයක අගමැතිවරයා ආණ්ඩුවේ නායකයා පමණක් වන අතර රාජ්‍යයේ නායකයා නොවේ.
- ජනාධිපති ආණ්ඩුක්‍රමයක බලතල බෙදීමේ මූලධර්මය හා සංවරණ හා තුලන මූලධර්මය ක්‍රියාත්මක වේ. එහෙත් කැබිනට් ආණ්ඩුක්‍රමයක එවැනි තත්ත්වයක් දක්ක ගත නොහැකිය.
- කැබිනට් ආණ්ඩුක්‍රමයක් දේශපාලන පක්ෂ ක්‍රමයක් මත පදනම් වී ඇති අතර ජනාධිපති ආණ්ඩුක්‍රමයකදී දේශපාලන පක්ෂ ක්‍රමය එතරම් ප්‍රබල නොවේ. තරගකාරී පක්ෂ ක්‍රමයක් නොපැවතියද, ජනාධිපති ක්‍රමයේ ආණ්ඩුවක් පැවතිය හැකිය.
- කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායක බලය නිරන්තරයෙන් වෘත්තීයමය දේශපාලන ප්‍රවීණයන් විසින් හොබවන අතර ජනාධිපති ආණ්ඩුක්‍රමයක එවැනි තත්ත්වයක් සැමවිටම දක්කගත නොහැක.

**නිගමනය (ලකුණු 03)**

ජනාධිපති සහ කැබිනට් ආණ්ඩුක්‍රම වශයෙන් සිදුකරන වර්ගීකරණය තුලනාත්මක දේශපාලන අධ්‍යයනයේ තේමාවකි. ඉහත විස්තර කර ඇත්තේ ශුද්ධ ජනාධිපති ක්‍රමයක සහ ශුද්ධ කැබිනට් ක්‍රමයක ලක්ෂණයයි. එහෙත් ඇතැම් රටවල මෙම ක්‍රම දෙකෙහිම සම්මිශ්‍රණයෙන් මිශ්‍ර නැතහොත් දෙමුහුන් ආණ්ඩුක්‍රම තිබිය හැකිය. ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින්නේ එවැන්නකි.

**4.** ශ්‍රී ලංකාවේ සිදු වූ යටත් විජිත පරිවර්තනයේ දේශපාලන පැතිකඩ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

www.alevelapi.com

**අභිමතාර්ථය**

මෙම ප්‍රශ්නයේ අරමුණ යටත් විජිත ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රතිසංස්කරණ සහ පරිවර්තන සඳහා යුරෝපීය යටත් විජිත පාලනය බලපෑ ආකාරය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම සහ අවබෝධය ඇගයීමයි. බ්‍රිතාන්‍ය පාලන කාලයට අවධානය යොමු කරමින්, කල්පවත්නා දේශපාලන ප්‍රතිඵල ඇතිකරන ලද දේශපාලන වෙනස්වීම්වල ප්‍රධාන අංග ගැන මෙම පිළිතුරේදී සාකච්ඡා කිරීම අවශ්‍යය.

**හැඳින්වීම (ලකුණු 03)**

පෘතුගීසි හා ලන්දේසි පාලනයෙන් ලංකාවේ ආරම්භ වූ යටත් විජිත පාලනය පිළිබඳව කෙටි සඳහන් කිරීමකින් පිළිතුර ආරම්භ කළ හැකි ය. ලංකාවේ සමාජයට තම පූර්වගාමිකයන් සිදුකළාට වඩා විශාල බලපෑමක් සිදු කිරීමට බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයෝ සමත් වූහ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

යටත් විජිතයේ නව රාජ්‍යයක් ස්ථාපනය කිරීමට බ්‍රිතාන්‍ය යටත් විජිත කාරකයින් උත්සුක වූ අතර, ආර්ථික, සමාජ, සංස්කෘතික සහ පරිපාලන ක්ෂේත්‍රවල වෙනස්කම් ඇති කරනු ලැබිණ. එම ප්‍රතිසංස්කරණවල අරමුණ වූයේ දිවයින පූර්ණ යටත් විජිතයක් බවට පරිවර්තනය කිරීමයි.

**සාකච්ඡාව (ලකුණු 14)**

- යටත් විජිත පාලනයෙන් සිදුවූයේ විජිතයේ සමාජය, ආර්ථිකය, දේශපාලනය හා ජනතාවගේ ජීවිතය යන සෑම ක්ෂේත්‍රයකම වෙනස්කම් ඇති කරමින්, දේශපාලන පරිවර්තනයක් ද ඇති කිරීමයි.
- යටත් විජිත පාලකයන් මුල දී කරන්නේ, යුද්ධයෙන් අත්පත් කර ගත් විජිතයේ හමුදා ඒකාධිපති පාලන තන්ත්‍රයකට සමාන ආණ්ඩුක්‍රමයක් පිහිටුවීමයි. ප්‍රතිසංස්කරණය ඉදිරිපත් කළේ පසුවය. සාමාන්‍යයෙන් එවැනි ප්‍රතිසංස්කරණවල ආදර්ශය වූයේ මව් රටේ දේශපාලන ක්‍රමයයි. බ්‍රිතාන්‍ය විජිතයක් වූ නිසා ලංකාවේ ද හඳුන්වා දෙන ලද දේශපාලන හා පරිපාලන ප්‍රතිසංස්කරණවලට බ්‍රිතාන්‍ය ආභාසය ලැබිණ.

<u>දේශපාලන ප්‍රතිසංස්කරණ</u>

- දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ආරම්භ වූයේ 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගිනි. මේ ප්‍රතිසංස්කරණවලින් ලංකාවේ අනාගත මධ්‍යගත රාජ්‍යයකට පදනම වැටිණ.
- ලංකාවේ ව්‍යවස්ථාමය සහ වගකියන ආණ්ඩුක්‍රමයකට මුල පුරන ලද්දේද කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ විසිනි.
- ආණ්ඩුකාරයාගේ හිතුවක්කාර බලතල සීමා කිරීමට ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම, අනාගත පාර්ලිමේන්තු සහ නියෝජන ආණ්ඩුක්‍රමයක ආරම්භය විය.
- 1910දී කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණ විසින් හඳුන්වා දෙන ලද දේශපාලන ප්‍රතිසංස්කරණ වලින් සීමිත ඡන්ද බලයක් මත පදනම් වූ නියෝජන ආණ්ඩුක්‍රමයක ආරම්භය ඇතිවිය.
- ඡන්ද බලය මත පදනම වූ වාර්ගික නියෝජන ක්‍රමය හඳුන්වාදෙන ලද්දේ ද මැකලම් ප්‍රතිසංස්කරණ මගිනි. වාර්ගික නියෝජනය පසුකාලයේ ලංකාවේ මැතිවරණ දේශපාලනයේ විවාදාත්මක තේමාවක් විය.
- 1920දී මැනිං ප්‍රතිසංස්කරණ මගින් භූමි ප්‍රදේශය නැතහොත් ඡන්ද කොට්ඨාශ මත පදනම් වූ නියෝජන මූලධර්මය ද හඳුන්වා දෙනු ලැබිණ. මහත් විවේචනයට ලක්වූ වාර්ගික නියෝජනයට විකල්පයක් ලෙස පසුව මතු වූයේ මෙම කොට්ඨාශ නියෝජන ක්‍රමයයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මෙම නියෝජන ක්‍රමයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මුදුන් පත්වූයේ 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලිනි.
- ඡන්ද බලය පොදු ජනයාට ව්‍යාප්ත වීමත්, නියෝජන ක්‍රමය මත පදනම් වූ ව්‍යවස්ථාදායකය නිසාත්, දේශපාලන බලය, ධනය හෝ සමාජ තත්ත්වය නැති සාමාන්‍ය ජනතාව අතටද මාරු විය. 1931දී සිදුවූයේ යටත් විජිතයක සිදුනොවන තරමේ ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් බිහි කිරීමට තුඩුදුන් වෙනසකි.
- සර්ව ජන ඡන්ද බලය මත පදනම් වූ මැතිවරණ ක්‍රමය සහ ව්‍යවස්ථාදායකය නිසා සාමාන්‍ය ජනතාව මත රඳා පැවතීමට දේශපාලන ප්‍රභූ පංතියට ද බල කෙරිණ.
- විධායක කාරක සභා ක්‍රමය තුළ හඳුන්වා දෙන ලද අමාත්‍ය මණ්ඩලය, පසුකාලීන ලංකාවේ කැබිනට් ආණ්ඩුක්‍රමයේ පූර්වගාමිකයා විය.
- විසිවැනි සියවසේ මුල්භාගය තුළ යටත් විජිත ලංකාවේ සමාජ හා දේශපාලන ක්ෂේත්‍රවල සිදු වූ අර්ධ-ප්‍රජාතන්ත්‍රීයකරණයේ පසුබිම තුළ, සිවිල් සමාජ ව්‍යාපාර ද බිහි විය. වෘත්තීය සමිති, ස්ත්‍රී සංවිධාන, ජාතිකවාදී හා ආගමික සංවිධාන, දේශපාලන සමිති සමාගම්, පුවත්පත්වල සහ සාක්ෂරතාවයේ ව්‍යාප්තිය, ශ්‍රී ලංකාවේ යටත් විජිත සිවිල් සමාජය වර්ධනය වීමේ වැදගත් මං සළකුණු ය.

**නිගමනය (ලකුණු 03)**

ඉහත සාකච්ඡාවේ කෙටි සාරාංශයකින් 'නිගමන' කොටස ආරම්භ කළ හැකිය. එහි පහත සඳහන් තේමා ඇතුළත් කළ හැකිය.

i. ලංකාව දේශපාලන සහ පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කිරීම.
ii. මධ්‍යගත රාජ්‍ය ව්‍යූහයක් ආරම්භ කර එයට පදනම දැමීම.
iii. දේශපාලන ක්‍රමය හා සමාජය ක්‍රමික ප්‍රජාතන්ත්‍රීයකරණයකට භාජනය වීම.
iv. නූතන ප්‍රජාතන්ත්‍රවාදයට පදනම වැටීම.
v. වාර්ගික දේශපාලනයේ ආරම්භය, සහ
vi. දේශපාලන ක්‍රමය විවෘත වීම සහ සිවිල් සමාජයේ නැඟීම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**5.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ එල්ල වූ විවේචන

(ii) විධායකයේ බලතල සහ කාර්යයන්

(iii) ව්‍යවස්ථාදායකයේ බලතල සහ කාර්යයන්

**(ලකුණු 20)**

**i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව එල්ල වූ විවේචන (ලකුණු 10)**

**අභිමතාර්ථය**

මේ මාතෘකාවේ අරමුණ, සෝල්බරි ව්‍යවස්ථාව පිළිබඳව එල්ල වූ ප්‍රධාන විවේචන පිළිබඳව අපේක්ෂකයන් සතු අවබෝධය සහ දැනුම පරීක්ෂා කිරීමයි. එහිදී ව්‍යවස්ථාවේ සමස්තය පිළිබඳව ද අවබෝධයක් අපේක්ෂකයින් සතුව ඇතැයි අපේක්ෂා කෙරේ.

**හැඳින්වීම (ලකුණු 02)**

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ලංකාවට හඳුන්වා දුන්නේ බ්‍රිතාන්‍ය වෙස්මින්ස්ටර් ආකෘතියට අනුව සකස් කරන ලද පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකි. එය අගමැතිවරයා නායකත්වය දුන් දේශපාලන විධායකයකින් ද සමන්විත වූ කැබිනට් ආණ්ඩුක්‍රමයක් විය. සෝල්බරි ව්‍යවස්ථාව නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ගොඩනැගූ එකක් වුවද, එය ලංකාවේ ජාතිකවාදී සහ වාමාංශික බලවේගවල මහත් විවේචනවලට ලක් විය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- සෝල්බරි ව්‍යවස්ථාවට එල්ල වූ ප්‍රධාන විවේචනයක් වූයේ එය ලංකාවට ප්‍රදානය කළේ පූර්ණ නිදහසක් නොව, ඩොමිනියන් තත්ත්වයක් ය යන්නයි. ඒ නිසාම ලංකාවේ නියම බලය තවදුරටත් බ්‍රිතාන්‍ය පාලකයින් අතෙහි පවත්වා ගැනීමට හැකි වූ බවත්, එමගින් රටේ ආර්ථික, සමාජ, දේශපාලන සහ ආණ්ඩුක්‍රමික ව්‍යුහයන්ට සහ ක්‍රියාවලියට බලපෑම් කිරීමට ඔවුන්ට හැකි වූ බවටත් විවේචන එල්ල විය. උදාහරණයක් ලෙස බ්‍රිතාන්‍යයන් නිදහස ප්‍රදානය කිරීමේදී, රාජ්‍ය සේවය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ගිවිසුම් 3ක් අත්සන් කළ අතර එමගින් ඒ අදාළ ක්ෂේත්‍රයන්හි නීති සම්පාදනය පිළිබඳ පූර්ණ බලයක් ලංකාවේ පාර්ලිමේන්තුවට හිමි නොවී ය. බ්‍රිතාන්‍ය කිරීටය ලංකාවේ රාජ්‍ය නායකත්වය ලෙස දිගටම පැවතීම ද මහත් විවේචනයට ලක් විය. විවේචකයින් තර්ක කළේ මෙම කරුණ නිසා, ලංකාව යටත් විජිත පාලනයෙන් සම්පූර්ණ කැඩී වෙන්වීමක් සිදු නොවූ බවයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මෙම නිසා යටත් විජිත පාලකයන් පිළිබඳ පසමිතුරු ආකල්ප තවත් තියුණු විය. ඒ නිසාම සෝල්බරි ව්‍යවස්ථාව ලංකාවට සම්පූර්ණ දේශපාලන නිදහසක් ප්‍රදානය කළේ නැත යන තර්කය ද පැතිරුණි.
- සෝල්බරි ආණ්ඩුක්‍රමය විසින් ලංකාවට හඳුන්වා දෙන ලද ව්‍යවස්ථා නීති සම්ප්‍රදායද මුළුමනින්ම බ්‍රිතාන්‍ය නෛතික, දේශපාලන සහ හර පද්ධතීන්ට අනුව සකස් වූවකි. එය ඒකීය ව්‍යුහයක් ද රාජ්‍යයට සැපයුවේය. මෙය ද්‍රවිඩ සුළුතර ප්‍රජාවගේ මහත් කණස්සල්ලට තුඩුදුන් කරුණක් විය.
- නීති සම්පාදනය පිළිබඳ පාර්ලිමේන්තුවට පූර්ණ පරමාධිපත්‍ය බලයක් ලැබුණේ නැත. සෝල්බරි ව්‍යවස්ථාව හරහා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය ආකාර කිහිපයකින්ම සීමා කෙරිණ. බ්‍රිතාන්‍ය කිරීටයට, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මාර්ගයෙන් තම පල ප්‍රයෝජන ආරක්ෂා කර ගැනීමට, ලංකාව සඳහා නීති සම්පාදනය කිරීමේ බලය තිබිණ. ලංකා පාර්ලිමේන්තුව පනවන නීති බලාත්මක නොකිරීමේ බලය ද කිරීටයට තිබිණ. එම බලය පැවරී තිබුණේ කිරීටය නියෝජනය කළ අග්‍රාණ්ඩුකාරවරයාටය. පාර්ලිමේන්තුවේ සම්මත වන නීතියක් නීතිගත වීම සඳහා අවශ්‍ය කිරීටයේ කැමැත්ත ප්‍රකාශ කිරීම හෝ නොකිරීමට අග්‍රාණ්ඩුකාරවරයාට බලය තිබිණ (36 වගන්තිය).
- ව්‍යවස්ථාවේ 29 (1) (2) සහ (3) වගන්තිය, සුළුජන හෝ සුළු ආගමික කණ්ඩායමක් වෙනස්කම්වලට භාජනය කරන නීති පැනවීමේ හැකියාව දැඩි ලෙස සීමා කළේ ය.
- ලංකාවට අදාළ අවසාන අභියාචනා අධිකරණය වූයේ එංගලන්තයේ ප්‍රිවි කවුන්සිලයයි. මෙය සුළු වාර්ගික සහ සියලු ජාතිකවාදි කොටස්වල විවේචනයට ලක් වූ තවත් කරුණකි.
- සෙනෙට් සභාව ද විශාල විවේචනයට භාජනය විය. එහි මන්ත්‍රීවරුන් මහජන ඡන්දයෙන් තෝරාපත් නොවීම නිසා එය මහජන මන්ත්‍රී මණ්ඩලයේ ව්‍යවස්ථාදායක බලයට හානියක් කරන්නක් වීය යන්න සමහර විවේචකයන්ගේ මතය විය.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම පරිච්ඡේදයක් හෝ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් හෝ සෝල්බරි ව්‍යවස්ථාවේ තිබුණේ නැත. මෙයද විවේචනයට ලක් වූ කරුණකි.
- වාමාංශික පක්ෂ සහ ජාතිකවාදී කොටස් පවසා සිටියේ යටත් විජිත පාලකයින් ලංකාවට අසම්පූර්ණ නිදහසක් පරිත්‍යාග කළේ, යටත් විජිත ක්‍රමය පවත්වා ගැනීමේ අරමුණකින් බවයි. එබැවින් ඔවුන් පෙනී සිටියේ යටත් විජිතවාදයේ උවමනාවන් සඳහාය යන්න මෙම විවේචනයේ ගැබ් වී තිබිණ.
- දෙමළ ජනතාවට සමාන නියෝජනයක් ලබා නොදීම නිසා දෙමළ සමාජයේ ද සෝල්බරි ව්‍යවස්ථාව පිළිබඳ විවේචනයක් මතු විය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 02)**

සෝල්බරි ව්‍යවස්ථාව විසින් ලංකාවේ යටත් විජිත පාලනය අවසන් කර, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකට පදනම දමන ලද නමුත්, එය විවිධ අංශවල විවේචනයට පාත්‍ර විය. එම විවේචන අතර කේන්ද්‍රීය විවේචනය වූයේ සෝල්බරි ව්‍යවස්ථාව ලංකාවට පූර්ණ ස්වාධිනත්වය ප්‍රදාන කළේ නැත යන්නයි. 1972 පළමු වැනි ජනරජ ව්‍යවස්ථාව සම්මත කරන ලද්දේ මෙම විවේචන පිළිබඳ පසුබිම තුළ සෝල්බරි ව්‍යවස්ථාව ද අහෝසි කරමිනි.

**ii. විධායකයේ බලතල සහ කාර්යයන් (ලකුණු 10)**

**අභිමතාර්ථය**

මේ මාතෘකාවෙන් අපේක්ෂා කරන්නේ සෝල්බරි ව්‍යවස්ථාව යටතේ විධායකයේ සංයුතිය, බලතල සහ කාර්යයන් පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම පරික්ෂා කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ විධායකය කොටස් දෙකකින් සමන්විත වූ බව කියමින් හැඳින්වීම ආරම්භ කළ හැකිය. ඒ දෙක නම් නාමික විධායකය හා තථ්‍ය නැතහොත්, දේශපාලන විධායකයයි. නාමික විධායකයේ ප්‍රධානියා වූයේ අග්‍රාණ්ඩුකාරවරයායා. තථ්‍ය විධායකයේ ප්‍රධානියා වූයේ, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියාද වූ අගමැතිවරයායා. නාමික විධායකය, අගමැතිවරයාගේ යෝජනාව මත බ්‍රිතාන්‍ය කිරීටය විසින් පත් කරන ලද අතර, තථ්‍ය විධායකයේ ප්‍රධානියා වූ අගමැතිවරයා පත් කරන ලද්දේ අග්‍රාණ්ඩුකාරවරයා විසිනි. එම අගමැතිවරයා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ බහුතරයේ සහය හිමි මන්ත්‍රීවරයා ද විය.

මෙම පිළිතුර කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් නාමික විධායකය සහ තථ්‍ය විධායකය යනුවෙනි.

**නාමික විධායකය ගැන සාකච්ඡාව (ලකුණු 03)**

- නාමික විධායකයේ ප්‍රධානියා බ්‍රිතාන්‍ය රජුගේ/ රැජිණගේ නියෝජිතයා වූ අතර, ඔහු ක්‍රියා කළේ බ්‍රිතාන්‍ය කිරීටයේ ද, ලංකාවේ අගමැතිවරයාගේ ද උපදෙස් මතය. බ්‍රිතාන්‍ය කිරීටය අපේක්ෂා කළේ අග්‍රාණ්ඩුකාරවරයා, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පල ප්‍රයෝජනවලට සේවය කිරීමය.
- අග්‍රාණ්ඩුකාරවරයා රාජ්‍ය නායකයා වූ අතරම සන්නද්ධ හමුදාවල සේනාධිනායකයා ද විය. රාජ්‍ය නායකයා ලෙස ඔහු රාජ්‍ය මුද්‍රාවේ භාරකාරයා වූ අතර තානාපතිවරුන් පත් කළේත්, ඔවුන්ට අක්තපත්‍ර ප්‍රදානය කළේත් අග්‍රාණ්ඩුකාරවරයායා.
- පාර්ලිමේන්තු මැතිවරණයකින් පසු පාර්ලිමේන්තුවේ වැඩිම ආසන ගණනක් හිමි කර ගන්නා පක්ෂයේ නායකයා අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කිරීමේ බලය තිබුණේ අග්‍රාණ්ඩුකාරවරයාට ය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- රාජ්‍ය සේවා කොමිෂමේ සාමාජිකයින්, විගණකාධිපති, නීතිපති, සන්නද්ධ හමුදාවල ප්‍රධානීන්, මැතිවරණ කොමසාරිස්වරයා සහ පාර්ලිමේන්තු මහලේකම්වරයා පත් කිරීමේ බලය තිබුණේ අග්‍රාණ්ඩුකාරවරයාට ය.
- රාජාසන කථාව කියවීම, අග්‍රාණ්ඩුකාරවරයාගේ වැදගත් වගකීමකි. ඔහු පාර්ලිමේන්තුවේ දී කියවන එම කථාවෙන්, ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙලවල් ද, ඉදිරි ගමන්මග ද ප්‍රකාශ විය. එය කෙටුම්පත් කරන්නේ අගමැතිවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි.
- පාර්ලිමේන්තුව කැඳවීම, වාරාවසාන කිරීම සහ විසුරුවා හැරීමේ වගකීම තිබුණේ අග්‍රාණ්ඩුකාරයාටය. එහෙත් තථ්‍ය බලයක් නොවේ. නාමික බලයකි. අග්‍රාණ්ඩුකාරවරයා මේ කාර්යයන් කළේ අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මතය.
- පාර්ලිමේන්තුවේ සම්මත කරන පනත් කෙටුම්පතක් නීතියක් වන්නේ කිරීටය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාරවරයා දෙන අනුමැතියෙන් පසුවය.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පත් කළ මන්ත්‍රීන් 6 දෙනා ද, සෙනට් සභාවේ මන්ත්‍රීවරුන් 15 දෙනෙකු ද පත්කළේ අග්‍රාණ්ඩුකාරවරයාය. මෙම බලය ද නාමික බලයක් විය.
- ඉහළ උසාවිවල විනිශ්චයකාරවරුන් පත් කිරීම, අධිකරණ සේවා කොමිෂමේ සාමාජිකයන් පත් කිරීම සහ සිරකරුවන්ට සමාව දීම ද අග්‍රාණ්ඩුකාරවරයාගේ අනෙකුත් නාමික බලතල අතර විය.

**තථ්‍ය විධායකය ගැන සාකච්ඡාව (ලකුණු 03)**

තථ්‍ය විධායකයට අයත් වූයේ අග්‍රාමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලයයි. එය දේශපාලන විධායකය නමින් ද හැඳින්විණ. තථ්‍ය විධායකයට අයත් බලතල මෙපරිදි විය.

- පාර්ලිමේන්තුව පණවන නීති ක්‍රියාත්මක කරවීම.
- වාර්ෂික විසර්ජන පනත සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකියන බව සහතික කිරීම.
- අමාත්‍යාංශ සහ ඒවා යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම.
- අග්‍රාණ්ඩුකාරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කළ යුතු පත්කිරීම්වල දී උපදෙස් සැපයීම.
- ඇමතිවරුන් පත්කිරීම, ඔවුන්ගේ අමාත්‍යාංශ නියම කිරීම සහ මාරුකිරීම යන කාර්යයන්හිදී අග්‍රාණ්ඩුකාරවරයාට උපදෙස් දුන්නේ අග්‍රාමාත්‍යවරයාය. සෙනට් සභාවේ හා පාර්ලිමේන්තුවේ නාමකරණය කරන ලද මන්ත්‍රීවරුන් පත් කිරීමට උපදෙස් සැපයුවේද අග්‍රාමාත්‍යවරයාය.
- විදේශ අමාත්‍යාංශය හා ආරක්ෂක අමාත්‍යාංශය පැවතියේ අග්‍රාමාත්‍යවරයා භාරයේය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 02)**

ඉහත සාකච්ඡාවේ ඉතා කෙටි සාරාංශයක් මෙහිදි ඉදිරිපත් කළ හැකිය. දේශපාලන විධායකය සහ නාමික විධායකය අතර වරින් වර ගැටුම් ඇති වුවත් එම ආයතන දෙක අතර සාමාන්‍යයෙන් පැවතියේ සහයෝගතා සම්බන්ධයක් බවත් දැක්විය හැකි ය. 1972 පළමු වැනි ජනරජ ව්‍යවස්ථාවෙන් නාමික විධායකයේ බ්‍රිතාන්‍ය කිරීටය සමග පැවැති සම්බන්ධය අවසන් කෙරිණ.

**iii. ව්‍යවස්ථාදායකයේ බලතල සහ කාර්යයන් (ලකුණු 10)**

**අභිමතාර්ථය**

මෙම මාතෘකාවෙන් අපේක්ෂා කරන්නේ සෝල්බරි ව්‍යවස්ථාව විසින් ලංකාවේ ඇතිකරන ලද පාර්ලිමේන්තුව, එහි බලතල සහ කාර්යයන් පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය කිරීටය, අග්‍රාණ්ඩුකාරයා සහ සුළුජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ විධිවිධාන මගින් සීමා කරන ලද බව පවසමින් පිළිතුර ආරම්භ කළ හැකිය. එසේ වුවත්, සුළුජන කොටස්වලට අවාසි වන නීති පැනවීමේදී මේ තත්ත්වයෙන් බාධා නොපැමිණි බව ද කිව හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව මණ්ඩල දෙකකින් සමන්විත විය. ඒවා නම් සෙනේට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයයි. සෙනට් සභාව ඉහළ මණ්ඩලය වූ අතර, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය පහළ මණ්ඩලය විය.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නියෝජිතයන් තෝරා ගැනීමේ ව්‍යූහය සහ මැතිවරණ ක්‍රමය ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තියෙන් විස්තර විය. මන්ත්‍රීන් 95 දෙනෙකු ඡන්ද කොට්ඨාශ මත සිදුවන නියෝජන ක්‍රමයට අනුව තෝරා පත් කෙරිණ. හයදෙනෙකු අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිණ. ඔවුන් සාමාන්‍යයෙන් නියෝජනය නොලැබෙන සුළු ජන කණ්ඩායම් නියෝජනය කළ යුතු විය.
- පාර්ලිමේන්තුවේ ධුර කාලය අවුරුදු 5ක් විය. එහි සභාපතිවරයා වූයේ කථානායකවරයායි. බලයේ සිටින ආණ්ඩුව බිඳවැටීම හේතු කොට ගෙන ව්‍යවස්ථාවේ දක්වා ඇති ධුර කාලය සම්පූර්ණ වීමට ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි ය. රාජාසන කථාව පිළිබඳව ස්තුති යෝජනාව පරාජය වීම, අයවැය යෝජනාව පරාජය වීම හා විශ්වාසභංග යෝජනාව සම්මත වීම ඒ සඳහා සාමාන්‍යයෙන් හේතු විය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බලතල

- රටට අවශ්‍ය නීති පැනවීම.
- විධායකයේ කටයුතු අධීක්ෂණය කිරීම.
- වාර්ෂික විසර්ජන පනත සම්මත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.
- පාර්ලිමේන්තුවට මූල්‍ය පනත් ඉදිරිපත් කිරීම.
- මහජන මුදල් පාලනය.

සෙනේට් සභාවේ බලතල

- සෙනේට් සභාව පාර්ලිමේන්තුවේ දෙවැනි මණ්ඩලය වූ අතර, එහි මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 30ක් විය. එයින් 15ක් අග්‍රාණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලැබූහ. සුළු ජන කොටස්වලට මෙහිදී ප්‍රමුඛත්වය ලැබෙතැයි අපේක්ෂා කෙරිණ. සෙනේට් සභාව සුළු ජන අයිතිවාසිකම් රැකීමේ යාන්ත්‍රණයක් යැයි ද සළකනු ලැබිණ.
- සෙනේට් සභාවේ මන්ත්‍රී ධූර කාලය අවුරුදු 6ක් විය. සෑම අවුරුදු දෙකකට වරක් මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක් ධූරකාලය අවසන් වී අලුත් මන්ත්‍රීවරුන් පත් කරන ලදහ.
- සෙනේට් සභාවට සාමාන්‍ය නීති පැනවීමේ බලය ද හිමි වුව ද මුදල් පනත් ඉදිරිපත් කළ නොහැකි විය (31 වගන්තිය). එහෙත් ඒවා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඒවා තරම් ශක්තිමත් ඒවා නොවීය. සෙනේට් සභාවට පනත් ප්‍රමාද කිරීමේ හැකියාව තිබිණ. එය සිදු වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සම්මත කර එවා තිබෙන පනත් කෙටුම්පතකට ඡන්දය විමසීම කල් දැමීමෙනි. එසේ වන පනත් දෙවැනි වරට ඡන්දය විමසා අනුමැතිය ලබා ගැනීමෙන් පසු මහජන මන්ත්‍රී මණ්ඩලයේ සම්මත කර ගත හැකි විය.
- සෙනේට් සභාවේ ඇමතිවරුන් දෙදෙනෙකු කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු වූ අතර, එයින් එක් අයෙකු අධිකරණ අමාත්‍යවරයා විය යුතු විය.

**නිගමනය (ලකුණු 02)**

- සෝල්බරි පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකේ කාර්යයන් පිළිබඳ සැසඳීමක් මෙහිදී ඉදිරිපත් කළ හැකිය. නිදසුන් ලෙස, සංසන්දනාත්මකව බලන විට සෙනේට් සභාව දුර්වල ව්‍යවස්ථාදායක සභාවක් විය. එයින් අපේක්ෂා කළ පරමාර්ථ ද බොහෝ දුරට ඉටු නොවීය. සෙනේට් සභාව ''සුදු අලියෙකු'' යන විවේචනය මතු වූයේ ද ඒ නිසාය. මේ අතර නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන්, සිදු වූයේ සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තිබි විධි විධාන ද නොසලකා හැරීමයි. මේ අතර, සෝල්බරි ව්‍යවස්ථාදායකය, නිසි පරමාධිපත්‍ය බලය නොතිබුණු ව්‍යවස්ථාදායකයක් වීය යන විවේචනය ද දැඩි ලෙස මතු වී තිබුණි. මෙහි ප්‍රතිඵලය වූයේ 1972 ජනරජ ව්‍යවස්ථාව විසින් ව්‍යවස්ථාදායකය සම්පූර්ණ ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කිරීමයි. ඒ අනුව සෙනේට් සභාව අහෝසි කර, ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩල සභාවක් කරනු ලැබිණ. ඒ සමගම ජාතික රාජ්‍ය සභාව ලෙස යළි නම් කරන ලද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ව්‍යවස්ථාදායක බලයට තිබූ සියලු සීමා ඉවත් කරන ලදි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**6.** 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පැවැති සම්බන්ධතාව සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

**අභිමතාර්ථය**

මෙම පිළිතුර මගින් ඇගයීමට ලක් කෙරෙන්නේ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය (ජාතික රාජ්‍ය සභාව) සහ විධායකය වූ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය අතර පැවැති සම්බන්ධතාව පිළිබඳ සිසු සිසුවියන්ගේ දැනුමයි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවැති ආණ්ඩුක්‍රම රාමුව තුළ මෙම පිළිතුර සකස් කළ යුතුය.

**හැඳින්වීම (ලකුණු 03)**

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කෙටි විග්‍රහයක් කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය. එනම්, වෙස්ට්මින්ස්ටර් ආකෘතිය තවදුරටත් අනුගමනය කළ ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බවයි. ඊට දෙමුහුන් ලක්ෂණ තිබුණි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව ඒක මාණ්ඩලික වූ අතර සෙනේට් සභාවක් නොවීය. ව්‍යවස්ථාදායකය හැඳින්වූයේ ජාතික රාජ්‍ය සභාව ලෙසය. එහි සාමාජිකයන් ජනතා ඡන්දයෙන් පත්වූ අතර, එය ජනරජයේ රාජ්‍ය බලයේ උත්තරීතර උපකරණය විය. ඇතැම් අවස්ථාවල මෙම උත්තරීතරභාවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයන් විසින් බලතල බෙදීමේ සිද්ධාන්තය නොසලකා ක්‍රියා කිරීමක් බවට විචාරක මත පළ වේ. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ විධායකය මධ්‍යස්ථාන දෙකකින් යුක්ත විය. එනම්, ජනාධිපතිවරයාගෙන් සහ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයෙනි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ක්‍රියාකාරීත්වය විශ්ලේෂණය කිරීමේදී ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර සම්බන්ධය පිළිබඳ තේමාව ඉතා වැදගත්ය.

www.alevelapi.com

**සාකච්ඡාව (ලකුණු 14)**

- 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කරන ලදි. කෙසේ වුවත් එය පූර්ණ වශයෙන් ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොවන්නේ, අගමැතිවරයා විසින් ජනාධිපතිවරයා නම් කිරීම හේතුවෙනි. ජනාධිපතිවරයා විධායකයේ නාමික ප්‍රධානියා වූ අතර සැබෑ විධායක බලයක් භුක්ති වින්දේ නැත. සැබෑ විධායක බලය තිබුණේ අගමැති සහ කැබිනට් මණ්ඩලය වෙතයි. එසේම මොවුහු ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෝ වූහ. මේ තුළින් පිළිබිඹු වන්නේ, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වඩාත් බලවත් වූයේ නාමික විධායකයේ ප්‍රධානියා වූ ජනාධිපතිවරයා නොව ව්‍යවස්ථාදායකය බවයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය වූ ජාතික රාජ්‍ය සභාවට උත්තරීතර ව්‍යවස්ථාදායක බලයක් තිබුණි (44 වගන්තිය). ආණ්ඩුකරණ ව්‍යුහයේ කේන්ද්‍රීය ආයතනය වූයේ එයයි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වගන්තියට අනුව, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නංවන්නේ ව්‍යවස්ථාදායකය වූ ජාතික රාජ්‍ය සභාවයි. එහි 5 වගන්තියට අනුව, ජාතික රාජ්‍ය සභාව රාජ්‍ය බලයේ උත්තරීතර උපකරණයයි. එය ජනරජයේ ජනතාවගේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලය ක්‍රියාවට නැංවීය.
- 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, ජාතික රාජ්‍ය සභාවට සිය ව්‍යවස්ථාදායක බලය අත්හැරීමට, පැවරීමට හෝ වෙනත් කිසිදු ආකාරයකින් අන්සතු කිරීමට නොහැකි විය (45 වගන්තිය). මේ හරහා ජාතික රාජ්‍ය සභාවට නීති සම්පාදනය කිරීම සඳහා අසමසම බලයක් හිමිවිය.
- ජාතික රාජ්‍ය සභාවේ බහුතර බලය හිමි කර ගත් දේශපාලන පක්ෂය හෝ සන්ධානය තුළින් දේශපාලන විධායකය වූ අගමැති සහ කැබිනට් මණ්ඩලය පත් කරන ලදී. එබැවින් දේශපාලන විධායකය ව්‍යවස්ථාදායකයේ කොටසක් විය. ඒ අනුව අගමැතිවරයා සහ කැබිනට් අමාත්‍යවරු ජාතික රාජ්‍ය සභාවේ දේශපාලන නියෝජිතයෝ වූහ.
- අමාත්‍යාංශ සහ අමාත්‍යවරුන්ගේ විෂයයන් තීරණය කිරීම අගමැතිවරයාගේ වගකීමකි. එබැවින් විධායකයේ ප්‍රධානියා ලෙස කැබිනට් මණ්ඩලයේ සංයුතිය තීරණය කිරීමේ පූර්ණ බලය තිබුණේ අගමැතිවරයාටයි.
- 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායකය ස්ථාපිත කර තිබුණේ වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදායට අනුවය. ඉහත සඳහන් කරන ලද පරිදි විධායකය කොටස් දෙකකින් සමන්විත වූ අතර, නාමික විධායකය සහ දේශපාලන විධායකය යනු එම දෙකොටසයි. නාමික විධායකයේ ප්‍රධානියා ජනාධිපතිය. දේශපාලන විධායකය අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයෙන් සමන්විත වූ අතර, අගමැතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විය.
- දේශපාලන විධායකයේ ප්‍රධානියා වූ අගමැතිවරයා, ජාතික රාජ්‍ය සභාවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ උපරිම විශ්වාසය දිනාගත හැකි සාමාජිකයෙකු විය යුතු විය.
- අගමැතිවරයා ප්‍රබල නම් ඔහුට/ ඇයට ජාතික රාජ්‍ය සභාවට බලපෑම් කළ හැකි විය. ප්‍රායෝගික භාවිතයේදී දේශපාලන විධායකය එනම්, අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය, ඍජුවම ව්‍යවස්ථාදායකයට බලපෑම් කළහ.
- ජනාධිපතිවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීමට ජාතික රාජ්‍ය සභාවට බලය තිබුණි 26 (2) වගන්තිය. ඒ අනුව නාමික විධායකයේ ප්‍රධානියා ජනාධිපති ලෙස හැඳින්වුව ද, ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීන නැත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 03)**

1972 ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර සම්බන්ධතාවය පරස්පරතා සහිතය. ඒ වෙතින් නිර්මාණය වූයේ දුර්වල නාමික විධායකයක් සහ ප්‍රබල දේශපාලන විධායකයක් සහ ව්‍යවස්ථාදායකයකි. දේශපාලන විධායකය පත් වූයේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් අතරිනි. ජාතික රාජ්‍ය සභාව රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය වුව ද, ඇතැම් අවස්ථාවල අගමැති සහ කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයේ බලය අභිබවා ගියහ. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය උපත ලැබීම 1972 ජනරජ ව්‍යවස්ථාවේ තිබූ වෙස්ට්මින්ස්ටර් ක්‍රමයේ නෛසර්ගික ලක්ෂණයකි. මෙම ක්‍රමය තුළ ගැටුම්වලට එළඹෙනවාට වඩා ව්‍යවස්ථාදායකය සහ විධායකය උත්සාහ කරන බව පෙනුනේ සහයෝගයෙන් ක්‍රියා කිරීමටය.

**7.** 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ අදාළ සංශෝධනවලට සම්බන්ධ පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.

(i) රාජ්‍යයේ නායකයා වශයෙන් ජනාධිපතිගේ භූමිකාව
(ii) ව්‍යවස්ථාදායකයේ බලතල හා ඒවායේ සීමාවන්
(iii) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී අධිකරණය සතු වගකීම
(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැදගත්කම සහ එයට එල්ල වී ඇති විවේචන

(ලකුණු 20)

**අභිමතාර්ථය**

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ 1978 II වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංග කිහිපයක් පිළිබඳ අපේක්ෂකයන් සතු විෂය දැනුම සහ විග්‍රහාත්මක හැකියාව ඇගයීමට භාජනය කිරීමයි.

www.alevelapi.com

**7.i රාජ්‍යයේ නායකයා වශයෙන් ජනාධිපතිවරයාගේ භූමිකාව (ලකුණු 10)**

**අභිමතාර්ථය**

1978 II වන ජනරජ ව්‍යවස්ථාවට අනුව රාජ්‍යයේ නායකයා වශයෙන් ජනාධිපතිවරයාගේ භූමිකාව පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුම සහ අවබෝධය ඇගයීමට භාජනය කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

1978 II වන ජනරජ ව්‍යවස්ථාවට අනුව රාජ්‍යයේ නායකයාගේ භූමිකාව ජනාධිපතිවරයා විසින් හොබවන බවත් ඒ අතරම කැබිනට් මණ්ඩලයේ සහ ආණ්ඩුවේ නායකයා ද වන්නේය යන කරුණ පැහැදිලි කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය. මේ අනුව 1978 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නායකයා යනු හුදෙක් නාමික සහ ගෞරව තනතුරක් නොව, රාජ්‍ය ව්‍යුහයේ කේන්ද්‍රීය බල මධ්‍යස්ථානය ද විය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 06)**

1978 II වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට භූමිකා කීපයක් නිරූපණය කළ අතර, ඒ අතරින් රාජ්‍යයේ නායකයාගේ භූමිකාව ජනාධිපති ආණ්ඩුක්‍රමයක් යටතේ රාජ්‍යය නායකයා සතු කාර්යභාරය විය.

- 1978 II වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 සහ 34 වගන්ති අනුව රාජ්‍ය නායකයා ලෙසින් ජනාධිපතිවරයාගේ බලතල මෙසේ සාරාංශ කොට දැක්විය හැකිය.
- ජනාධිපතිවරයාට රාජ්‍ය නායකයා ලෙස විවිධ පත්කිරීම් කිරීමට බලය ව්‍යවස්ථාවෙන්ම හිමිවී ඇත. ඒවා අතර,
  තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන්, රාජ්‍ය දූතයන් පත් කිරීමට හා ඔවුන්ට බලතල පැවරීමට ද ඔවුන් පිළිගැනීමට ද බලය ඇත්තේය.
- නීතිඥ වෘත්තියේ විශිෂ්ඨත්වයට පත්ව ඇති නීතිඥවරයින් ජනාධිපති නීතිඥ ලෙස පත් කිරීම.
- අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා හා අනෙකුත් විනිශ්චයකාරවරයන් ද පත් කිරීම.
- රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීම.
- යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම.
- ව්‍යවස්ථාවේ ලිඛිත හා අලිඛිත විධිවිධානවලට පටහැනි නොවන ජාත්‍යන්තර නීති චාරිත්‍ර වාරිත්‍ර වලට එලඹීම.
- වරදකරුවන්ට කොන්දේසි සහිතව සමාව දීම හා පූර්ණ සමාව දීම.
- මරණීය දණ්ඩණය දීම හා අභය දානය දීම.
- නඩු පවරනු ලැබීමෙන් මුක්තිය ලැබීම ද ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා ලෙසට ලබා තිබුණ විශේෂ වරප්‍රසාදයකි. මෙය අදාළ වූයේ ජනාධිපතිවරයෙකු සිය ධූර කාලය තුළ සිදුකරන නිල හෝ පුද්ගලික කාර්යයන් සම්බන්ධයෙනි (35-1 වගන්තිය).

**නිගමනය (ලකුණු 03)**

රාජ්‍ය නායකයා වශයෙන් ජනාධිපතිවරයාට හිමි වු බලතල 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට හිමි වූ අති විශාල බලතල ප්‍රමාණයේ එක් අංගයක් වූ බව සඳහන් කරමින් පිළිතුර අවසන් කළ හැකිය. සමහර බලතල වැරදි සහ පක්ෂග්‍රාහී ලෙස ජනාධිපතිවරුන් භාවිතා කිරීම පිළිබඳව විවේචන එල්ල විය. එම විවේචන වලට ප්‍රතිචාර වශයෙන්, 19 වැනි සංශෝධනය මගින් ඉන් සමහරක් ඉවත් කළ බව ද කිව හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 7.ii ව්‍යවස්ථාදායකයේ බලතල හා ඒවායේ සීමා (ලකුණු 10)

### අරමුණ

1978 ව්‍යවස්ථාවෙන් ව්‍යවස්ථාදායකයට ලබා දී ඇති බලතල ගැනත් ඒවායේ සීමා පිළිබඳවත් අපේක්ෂකයන් සතු දැනුම පරීක්ෂා කිරීමයි.

### හැඳින්වීම (ලකුණු 02)

1978 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව ලෙස හැඳින්වූ බවත්, එය වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදායෙන් වෙන් වූ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් බවත් ප්‍රකාශ කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය. 1978 ව්‍යවස්ථාදායකයේ බලතල 1972 ව්‍යවස්ථාවෙන් බිහිකළ ජාතික රාජ්‍ය සභාවට බෙහෙවින් වෙනස් වූ බව ද ''හැඳින්වීම'' කොටසින් පෙන්වා දිය හැකිය. 1972 ව්‍යවස්ථාවෙන් එම තත්ත්වය වෙනස් කර ව්‍යවස්ථාදායකය විධායකයට ද්විතීය කරනු ලැබිණ.

### සාකච්ඡාව (ලකුණු 06)

ඉහත හැඳින්වීමේ ඉදිරිපත් කළ අවසාන කරුණ තවදුරටත් පැහැදිලි කරමින් සාකච්ඡාව ආරම්භ කළ හැකිය. ඒ අනුව ව්‍යවස්ථාදායකය ''විධායක ජනාධිපති'' ක්‍රමයක විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයාගේ පාලනය සහ අධිකාරිය යටතට පත් කෙරිණ.

සාකච්ඡාව උප මාතෘකා දෙකක් යටතේ සංවිධානය කර ගත හැකිය.

1. ව්‍යවස්ථාදායකයේ බලතල
2. ඒවායේ සීමා

ව්‍යවස්ථාදායකයේ බලතල පහත සඳහන් පරිදි කෙටියෙන් විස්තර කළ හැකිය:

- නීති සම්පාදන බලය.
- මූල්‍ය පාලනය.
- විධායකය පාලනය කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සහ අවලංගු කිරීම.

සීමාවන්:

- ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදක බලයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අත්හිටුවීමට හෝ බල රහිත කිරීම අයත් වන්නේ නැත. නව ව්‍යවස්ථාවක් පනවා සම්මත කරන්නේ නැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අත්හිටුවිය නොහැකිය (75 වගන්තිය).



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති යම් කිසි කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය අධිකරණයේ අභියෝගයට ලක් කර තිබේ නම්, ව්‍යවස්ථාදායකයට එම කෙටුම්පත සාකච්ඡා කොට නීතිගත කළ හැක්කේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුකූලවය. නැතහොත් 2/3 ක වැඩි ඡන්දයෙනි.
- නීති සම්පාදනය කිරීමෙන් සම්පූර්ණ බලය තිබෙන්නේ ව්‍යවස්ථාදායකයට නොවේ. අවශ්‍ය නම්, ජනාධිපතිවරයාට ද ජනමත විචාරණ මාධ්‍යයෙන් නීති පැනවිය හැකිය (4 වන වගන්තිය).
- ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෙකු නොවූව ද, ඔහු හෝ ඇය කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම නිසා, නීති සම්පාදන ක්‍රියාවලියට සෘජු බලපෑම් කල හැකිය.

**නිගමනය (ලකුණු 02)**

1978 ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය, 1972 ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද ව්‍යවස්ථාදායකයට වඩා වෙනස් ය. එය විශේෂයෙන් ම පෙනුනේ රාජ්‍ය ව්‍යුහය තුළ ව්‍යවස්ථාදායකයට හිමි ස්ථානය සම්බන්ධයෙනි. එයට නීති සම්පාදක බලය තිබුන ද, එම බලය විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයාගේ සෘජු පාලනයට යටත් විය. ඒ අනුව ව්‍යවස්ථාදායකය හා විධායකය අතර බලතල බෙදීමක් නොතිබුනා පමණක් නොව, ව්‍යවස්ථාදායකය විධායකයේ ආධිපත්‍යට යට වීමේ තත්ත්වයක් ද ඇති කළේය. මෙය 1978 ව්‍යවස්ථාව සම්බන්ධව එල්ල වූ දැඩි විවේචනවලට ද තුඩු දුන්නේ ය. 19 වෙනි සංශෝධනය මගින් මෙම සම්බන්ධතාව වෙනස් කර, ව්‍යවස්ථාදායකයේ සාපේක්ෂ ස්වාධීනත්වය නැවත පිහිටුවනු ලැබූයේ එම විවේචනවලට ප්‍රතිචාර වශයෙනි.

7.iii **මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී අධිකරණය සතු වගකීම. (ලකුණු 10)**

**අරමුණ**

පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සතු කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයින් සතු අවබෝධය පරීක්ෂා කිරීම ප්‍රශ්නයේ මෙම කොටසේ අරමුණ වේ.

**හැඳින්වීම (ලකුණු 02)**

මූලික අයිතිවාසිකම් යනු කවරේදැයි කෙටි අර්ථ විග්‍රහයක් ඉදිරිපත් කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය. තම මූලික අයිතීන් කඩවීම සම්බන්ධව අධිකරණයේ පිහිට ලබා ගැනීමට පුරවැසියන් සතු අවකාශ පුළුල් කිරීම නිසා 1978 ව්‍යවස්ථාව මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පියවරක් ඉදිරියට තැබූ බව ද මෙහිදි ප්‍රකාශ කළ හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡා (ලකුණු 06)**

1978 ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව පණවා ඇති විධි විධාන ගැන කෙටි හැඳින්වීමකින් පිළිතුර ආරම්භ කළ හැකිය.

- මූලික අයිතිවාසිකම් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල සහ ක්‍රියා පටිපාටිය, 1978 ව්‍යවස්ථාවේ 126 වගන්තියේ දක්වා තිබේ. ව්‍යවස්ථාවේ III හෝ IV වැනි පර්ච්ඡේදවලින් දක්වා ඇති මූලික අයිතිවාසිකමක් උල්ලංඝණය කිරීම සම්බන්ධව අධිකරණ බලය ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයට පමණක් බව කියා සිටියි. III වැනි පරිච්ඡේදය විස්තර කරන්නේ මූලික අයිතිවාසිකම්ය. IV වැනි පර්ච්ඡේදය විස්තර කරන්නේ භාෂා අයිතිවාසිකම්ය.
- එවැනි උල්ලංඝණය කිරීමක් සිදු වී මාසයක් ඇතුළතදී එවැනි ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතුවේ. එම ඉල්ලීම පුරවැසියාට ඍජුවම හෝ නීතිඥයෙකු මාර්ගයෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.
- එවැනි ඉල්ලීමක් තමන් වෙත ලැබුණු පසු ශ්‍රේෂ්ඨාධිකරණය මුලින්ම කරන්නේ, එම ඉල්ලීම ගැන විමසීමක් සිදු කිරීම අවශ්‍යද සහ සුදුසු ද යන්න තීරණය කිරීමයි. ඒ සඳහා අවසර ලබා දුන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය කරන්නේ නඩුව විමසා බලා තීන්දුවක් ලබා දේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගණනාවක්ම ඉදිරිපත් වුව ද, ශ්‍රේෂ්ඨාධිකරණය සතු මූලික අයිතිවාසිකම් විනිශ්චය සම්බන්ධ බලයේ වෙනසක් සිදු නොවීය. එසේ වුවත්, 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු වූ දෙයක් නම්, විධායකයේ බලපෑම්වලින් තොරව, අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීමයි. මේ මගින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ වගකීම වඩාත් ස්වාධීන සහ ශක්තිමත් කෙරිණි.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය තිබෙන එකම අධිකරණ ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණයයි.
- එසේ වුවත්, පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇති තවත් ආයතන දෙකක් තිබේ. ඒවා නම් මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව සහ ඔම්බුඩ්ස්මන් කාර්යාලයයි.
- පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම නිසා ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍යය සුරැකීම සම්බන්ධයෙන් ද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පුරවැසි නිදහස සුරැකීමේ මෙම වගකීම ශ්‍රේෂ්ඨාධිකරණය සතු වැදගත්ම කාර්යභාරයකි. එය සහතික කිරීමට නම් අධිකරණය විධායකයෙහි බලපෑම්වලින් නිදහස්ව තිබිය යුතුයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 02)**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, ශ්‍රේෂ්ඨාධිකරණය, පුරවැසි අයිතීන් සහ නිදහස ආරක්ෂා කිරීමේ වැදගත්ම ආයතනය බවට පත් කරන ලදි. මෙය 1978 ව්‍යවස්ථාව විසින් සිදුකරන ලද වැදගත්ම නිර්මාණයකි. පුරවැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වූ විට ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලයත්, අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියත් 1978 ව්‍යවස්ථාවෙන් පැහැදිලිවම දක්වා තිබේ. විධායකයේ බලය නොව පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධව කීර්තිනාමයක් දිනාගෙන පවත්වා ගැනීමට ද ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සමත් වී තිබේ.

## 7.iv ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැදගත්කම සහ එයට එල්ල වී ඇති විවේචන (ලකුණු 10)

**අභිමථාර්ථය**

මේ මාතෘකාවේ අරමුණ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 19 වැනි සංශෝධනවලින් පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමයි. සභාවේ කාර්යභාරය හා ඉටු කරනු ලබන කාර්ය පිළිබඳව සමාජයේ ඇති සාකච්ඡා පිළිබඳව අපේක්ෂකයින් සතු වැටහීම ද එයින් පරීක්ෂා කෙරේ.

**හැඳින්වීම (ලකුණු 02)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 17 හා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනවල නිර්මාණයක් බව සඳහන් කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සහ නීතියේ පාලනය සඳහා අවශ්‍ය සංවරණ සහ තුලන යාන්ත්‍රණයක් ලෙස එය වැදගත් ආයතනයක් බව ද සඳහන් කළ හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- 19 වැනි සංශෝධනය යටතේ පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය කෙටියෙන් විස්තර කිරීම.
- පහත සඳහන් කරුණු පදනම් කොටගෙන සභාවේ බලතල මොනවාදැයි හඳුන්වා දීම.
  - i. පහත සඳහන් ස්වාධීන කොමිෂන් සභාවල සභාපතිවරුන් පත් කිරීමට ජනාධිපතිවරයාට නිර්දේශ සැපයීම:
    මැතිවරණ කොමිෂම, රාජ්‍ය සේවා කොමිෂම, ජාතික පොලිස් කොමිෂම, විගණන සේවා කොමිෂන් සභාව, මානව හිමිකම් කොමිෂම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව, සීමා නිර්ණය කොමිෂන් සභාව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව,
  - ii. පහත සඳහන් තනතුරුවලට ජනාධිපතිවරයා කරන නිර්දේශ අනුමත කිරීම:
    ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමා සහ අනෙකුත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අනෙකුත් විනිශ්චයකාරවරුන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්, නීතිපතිවරයා, විගණකාධිපතිවරයා, පොලිස්පතිවරයා, ඔම්බුඩ්ස්මන්වරයා සහ පාර්ලිමේන්තු මහලේකම්වරයා.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

<u>විවේචන</u>

- ව්‍යවස්ථා සභාවට මහජනතාවගේ නියෝජනයක් නොමැති සිවිල් සමාජ සාමාජිකයන් පත් කිරීමත්, ඔවුන් විසින් ජනාධිපතිවරයාගේ බලය සංවරණය කිරීමක් ගැන අප්‍රසාදය පළ වී තිබේ.
- සභාවේ සංයුතිය තුළ ඇති බල තුලනය ආණ්ඩු පක්ෂයට වාසිසහගතය යන විවේචනය ද මතු වී ඇත.
- ජනාධිපතිතුමා අධිකරණයේ පත්වීම් සඳහා කළ නිර්දේශ, කොමිෂන් සභාව විසින් එතුමාගේ අධිකාර බලයට අභියෝග කරනු ලැබ ඇත යන විවේචනය මෑත කාලයේ දී මතු විය.

**නිගමනය (ලකුණු 02)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට අත්‍යවශ්‍ය අංගයක් වන ආණ්ඩුවේ, විශේෂයෙන් විධායකයේ, බලය සංවරණය කරන ආයතනයක් ලෙස වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇති බව පෙන්වා දීමෙන් නිගමනය ආරම්භ කළ හැකිය. රාජ්‍ය සේවය නිර්දේශපාලනීය කිරීම සහ විධායකයේ ප්‍රධානියා ලෙස ජනාධිපතිවරයා තම බලතල ඉක්මවා ක්‍රියා කිරීම වැලැක්වීම එයින් අපේක්ෂා කළ අරමුණුය. 17 වැනි සංශෝධනයේත් 19 වැනි සංශෝධනයේත් පසුබිම වූයේ ද එයයි. ව්‍යවස්ථා සභාව නිර්මාණය කරන ලද්දේ ඒ සඳහා අවශ්‍ය සංවරණ අධිකාරියක අවශ්‍යතාවය පැන නැග තිබුණ නිසාය. එවැනි සන්දර්භයක් තුළ සභාව පිළිබඳ විවේචන මතු වීම අමුතු දෙයක් නොවේ. සභාව පිළිබඳ මහජන විශ්වාසය නොබිඳෙන්නේ නම් එවැනි විවේචන ප්‍රයෝජනවත් ඒවාය.

**8.** ඉන්දීය සංධීය ආණ්ඩුක්‍රම මාදිලිය අර්ධ සංධීය ක්‍රමයක් යැයි විස්තර කිරීමට හේතු පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

**අභිමතාර්ථය**

මෙම ප්‍රශ්නයේ අරමුණ ඉන්දියානු සංධීය ක්‍රමයේ ඇති එයටම ආවේණික ලක්ෂණ හඳුනාගැනීමට සහ, ආණ්ඩුක්‍රමය සම්භාව්‍ය සංධිය ක්‍රමයෙන් වෙනස් වන නිශ්චිත මාදිලියක් බව පෙන්වාදීමට ඇති හැකියාවත් ඇගැයීමට භාජනය කිරීම.

**හැඳින්වීම (ලකුණු 03)**

ඉන්දියානු සංධීය ක්‍රමය සම්භාව්‍ය සංධීය ක්‍රමයෙන් වෙනස් වූ ආකෘතියක් බව සඳහන් කරමින් පිළිතුර ආරම්භ කළ හැකි ය. 1947 නිදහසින් පසු ඉන්දියාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ දී, වෙනස්කම් සහිත නව සංධීය රාමුවක් නිර්මාණය කිරීමට සිදුවීමේ පසුබිම ගැන ද කෙටියෙන් සඳහන් කළ හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 14)**

- ඉන්දීය සංඝීය ක්‍රමය සම්පූර්ණ සංඝීය ආණ්ඩුක්‍රමයක් නොවන බව ප්‍රකාශ කිරීම සඳහා සමහර විට එයට අර්ධ - සංඝීය ක්‍රමයක් යැයි හඳුන්වා තිබේ.
- ඉන්දියාව පැහැදිලිවම ඒකීය රාජ්‍යයක් නොවේ. ඉන්දියානු සමූහාණ්ඩුව පාලනය කරනු ලබන්නේ සාමාන්‍යයෙන් සංඝීය යැයි හැඳින්වෙන බලය විමධ්‍යගත කිරීමේ ආණ්ඩුක්‍රමයක් මගිනි. ප්‍රාන්ත ආණ්ඩුවලට තමන්ගේම විධායකයන් හා ව්‍යවස්ථාදායකයන් තිබේ. ව්‍යවස්ථාවේ ලැයිස්තු තුනක් මාර්ගයෙන් මධ්‍යම රජය සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බලය විමධ්‍යගත කොට තිබේ. එසේ වුවත්, ඉන්දීය ක්‍රමය සංඝීය ක්‍රමයකැයි ව්‍යවස්ථාව ප්‍රකාශ කරන්නේ ද නැත. ඒකීය ද, සංඝීය ද යන කරුණේ දී ව්‍යවස්ථාව නිහඬ ය.
- ඉන්දීය ක්‍රමය අර්ධ - සංඝීය යැයි හැඳින්වීමට තුඩු දී ඇති හේතු අතරින් පහත සඳහන් ඒවා සඳහන් කළ හැකි ය.
    i. ඉන්දියානු ජනරජය ඒකීය ද සංඝීය ද යන්න ගැන ව්‍යවස්ථාව පැහැදිලිව ප්‍රකාශ නොකරයි.
    ii. ව්‍යවස්ථාවේ 352 වගන්තියෙන් මධ්‍යම රජයට ලබා දී ඇති හදිසි අවස්ථා බලතලවලින් ප්‍රාන්ත රාජ්‍යවල බලය දැඩි ලෙස සීමා වේ. ජාතික හදිසි අවස්ථාවකදී අඛණ්ඩතාව, ආරක්ෂාව සහ ස්ථාවරභාවය ආරක්ෂා කිරීමේ සම්පූර්ණ බලය මධ්‍යම ආණ්ඩුව සතු ය.
    iii. ව්‍යවස්ථාවේ 356 වගන්තියට අනුව, ප්‍රාන්ත ආණ්ඩු විසුරුවා හැරීමේ සහ ඒවා ජනාධිපති පාලනය යටතට ගැනීමේ බලය ජනාධිපතිවරයාට තිබේ.
- හදිසි නීතිය යටතේ, ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති සංඝීයවාදී ජීව ගුණයට නිෂේධනීය ඵල විපාක ඇති වී තිබේ. හදිසි අවස්ථාවක දී සිදුවන්නේ ඉන්දීය සංඝීය රාමුව අත්හිටුවා, එය ඒකීය ක්‍රමයක් ලෙස පාලනය කරනු ලැබීමයි.
- ප්‍රාන්ත රාජ්‍ය මධ්‍යම ආණ්ඩුවේ සෘජු පාලනය යටතට ගැනිමේ මාර්ග කිහිපයක්ම තිබේ. පළමුව, ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය විසිරවිය හැකිය. එමෙන්ම ප්‍රාන්තවල ප්‍රධාන අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය ඇතුළු විධායකය නිල බලයෙන් ඉවත් කළ හැකිය. ඒ මගින් කෙරෙන්නේ ප්‍රාන්ත රාජ්‍යයේ විධායකය ජනාධිපතිවරයාගේ සෘජු පාලනය යටතට ගෙන ඒමයි. දෙවනුව, ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය විසිර වූ විට, ප්‍රාන්ත රාජ්‍යය වෙනුවෙන් නීති පණවන්නේ මධ්‍යම රජයේ පාර්ලිමේන්තුවයි. තෙවනුව, ජනාධිපතිවරයාගේ නියෝජිතයා වන ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා, ප්‍රාන්ත රාජ්‍ය ආණ්ඩුවේ ද ප්‍රධානියා බවට පත් වෙයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මධ්‍යම ආණ්ඩුවේ පාලක දේශපාලන පක්ෂය තමන්ට පස මිතුරු විරුද්ධ පක්ෂ පාලනය කරන ප්‍රාන්ත ආණ්ඩුව බලයෙන් නෙරපීමට 356 වගන්තිය අවභාවිත කර ඇතැයි යන චෝදනාව ඉදිරිපත් ව තිබේ. අගමැති ඉන්දිරා ගාන්ධි යටතේ පැවැති හදිසි අවස්ථා පාලන සමයේ දී මේ තත්ත්වය ඇති විය. මේ තත්ත්වය පන්ජාබ්, කාශ්මීර සහ උත්තර් ප්‍රදේශ යන ප්‍රාන්ත රාජ්‍යවල සිදු වීය.
- ශුද්ධ සංධීය ක්‍රමවල එවැනි හදිසි අවස්ථා බලතල මධ්‍යම ආණ්ඩුවට පැවරෙන්නේ නැත. ප්‍රාන්ත රාජ්‍යවල ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කිරීම සම්භාව්‍ය සංධීය ක්‍රමයේ අනිවාර්ය ලක්ෂණයකි.
- ඉන්දියාවේ ඇති කරන ලද මෙම වෙනස් සංධීය මාදිලිය බ්‍රිතාන්‍ය ඉන්දියාව දෙකඩ වීම, යන කරුණු පසුබිම් කොටගෙන බිහි වූවකි. 1952 දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරගන්නා විට ඉන්දියාවේ භෞමික අඛණ්ඩතාව සහ දේශපාලන ඒකාග්‍රතාව ආරක්ෂාවන පරිදි රාජ්‍ය ව්‍යුහය සකස් කිරීම, ව්‍යවස්ථා සම්පාදකයින්ගේ විශේෂ අවධානයට යොමු වූ කරුණකි.
- මෙපරිදි ඉන්දියාවේ ව්‍යවස්ථා සම්පාදකයින් මුහුණ දුන් ප්‍රහේලිකාව වූයේ ඉන්දියාවේ ඇති අතිමහත් විවිධත්වයට ඉඩ දෙන ගමන්ම, දේශපාලන ඒකත්වය ද ආරක්ෂා කිරීමයි.
- ඉන්දියාව අර්ධ - සංධීය ක්‍රමයක් වන්නේය යන්නෙහි අර්ථය වන්නේ සාමාන්‍ය තත්ත්වයක් තුළ එය සැබෑ සංධීය ක්‍රමයක් වන්නේය සහ හදිසි අවස්ථා තුළ ඒකීය ක්‍රමයක් වන්නේය යන අදහසයි.
- ඉන්දීය සංධීය ක්‍රමයේ ඇති අනෙක් ඒකීයවාදී ලක්ෂණ මෙසේය.
    i. එකම පුරවැසිභාවයක් තිබීම.
    ii. බලතල පිළිබඳ සමගාමී ලැයිස්තුව මධ්‍යම ආණ්ඩුවට වාසිදායකය.
    iii. ප්‍රාන්ත රාජ්‍යයකට අයත්වන භූමිය තීරණය කිරීමට මධ්‍යම රජයට ඇති තනි බලය.
    iv. ප්‍රාන්ත රාජ්‍ය බිහි කිරීමට, නම් කිරීමට සහ පවත්නා ඒවා වෙනස් කිරීමට මධ්‍යම රාජ්‍යයට ඇති බලය.
    v. මධ්‍යම පාර්ලිමේන්තුවේ උත්තර මන්ත්‍රී මණ්ඩලය වන රාජ්‍ය සභාවේ 2/3ක අනුමැතිය ඇතිව ප්‍රාන්ත රාජ්‍යය සඳහා නීති පැනවීමට මධ්‍යම පාර්ලිමේන්තුවට ඇති බලය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 03)**

ඉහත සාකච්ඡාව සාරාංශ කරමින් ඉන්දියානු සංධීය ක්‍රමය සුවිශේෂ සංධීය මාදිලියක් වන බව පෙන්වා දෙමින් පිළිතුර අවසන් කළ හැකිය. ඒ අනුව ඉන්දීය ක්‍රමයේ ඇති බලය විමධ්‍යගත කිරීමෙහි සංධීය සහ ඒකීය ලක්ෂණ ගැබ් වී තිබේ. ස්වාධිපත්‍යය මධ්‍යම රජය සහ ප්‍රාන්ත රාජ්‍යය අතර බෙදාගෙන නැත. ප්‍රාන්ත රාජ්‍යවලට ප්‍රාදේශීය ස්වායත්තතාව සෑමවිටම නොලැබේ. එම ස්වායත්තතාව වනාහී කොන්දේසි සහිත එකකි.

**9.** ලෝක දේශපාලනයේ සමකාලීන ප්‍රවණතා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

**අරමුණ**

මෙම ප්‍රශ්නයෙහි අරමුණ වන්නේ සිසුන් තුළ සමකාලීන ජාත්‍යන්තර දේශපාලනයෙහි ප්‍රවණතා පිළිබඳව ඇති දැනුමත්, එම ප්‍රවණතා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි කරන බලපෑම පිළිබඳ අවබෝධයත්, තක්සේරු කිරීමයි.

**හැඳින්වීම (උපරිම ලකුණු 03)**

- රටක විදේශ ප්‍රතිපත්තිය තීරණය වන්නේ අභ්‍යන්තර හා බාහිර සාධක ගණනාවක් මතය. එනිසාම, සමකාලීන ලෝකයේ රටවල විදේශ ප්‍රතිපත්තිය නිශ්චය කිරීමෙහි ලා ජාත්‍යන්තර පරිසරයෙහි සිදුවන වෙනස්වීම් අනිවාර්ය බලපෑමක් කරයි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාව කෙරෙහි ද පොදු ය. එනයින්, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය අඩු වැඩි වශයෙන් සමකාලීන කලාපීය සහ ගෝලීය ප්‍රවණතාවලට දක්වන ප්‍රතිචාරයක් ලෙස ද හැඳින්විය හැකි වේ.
- කෙසේ වෙතත්, කලාපීය හා ගෝලීය ප්‍රවණතාවන්ට දක්වන ප්‍රතිචාරයේ ස්වභාවය ශ්‍රී ලංකාවෙහි දේශපාලන හා ආර්ථික ධාරිතාවන් සහ භූ දේශපාලනික වැදගත්කම විසින් නිශ්චය කෙරේ.

**සාකච්ඡාව (උපරිම ලකුණු 14)**

- ඉන්දීය සාගරයේ මධ්‍යගතව පිහිටීම සහ ඉන්දු පැසිෆික් සාගරික ජල මායිමට සමීපව පිහිටීම යන භූ-දේශපාලනික ස්ථානගතවීම ශ්‍රී ලංකාව ලෝක බලවතුන්ගේ නොනිත් ආකර්ෂණය දිනා ගැනීම කෙරෙහි බලපා තිබේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

දකුණු ආසියාව

- සමස්ත පශ්චාත් නිදහස් ඉතිහාසය පුරාම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැසීම කෙරෙහි කලාපීය දේශපාලනයේ ප්‍රවණතා බලපා ඇත.
- විවිධ දේශපාලන හේතු මත මෑත කාලය වන විට දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානය වශයෙන් සාර්ක් සංවිධානයේ ජවය හීන වී තිබේ. මේ තත්ත්වය තුළ සාර්ක් අරබයා ශ්‍රී ලංකාවේ මැදිහත්වීම හුදු නියෝජනයකට පමණක් විතැන් වී ඇත. මේ ප්‍රවණතාවය සඳහා වර්තමාන පාලක දේශපාලන ප්‍රභූන්ගේ කලාපීය වාදයට වඩා ගෝලීයවාදය කෙරෙහි නම්‍ය වූ අභිලාෂයන් ද උදව් සපයා තිබේ.
- සෙසු දකුණු ආසියාතික රාජ්‍යයන් සේම, ශ්‍රී ලංකාව ද කලාපීය දේශපාලන ආර්ථිකය තුළ ඉන්දියාවේ භූමිකාව කෙරෙහි සංවේදී වෙයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියෙහි තේමා තීරණය කිරීම කෙරෙහි ඉන්දියාවේ දේශපාලනයේ හා පාලන තන්ත්‍රවල වෙනස්වීම් ද වැදගත් යෙදවුම් වී ඇත.

ආසියාව

- ලෝක දේශපාලන සහ ආර්ථික සිතියම්වල ස්වභාවය තීරණය කිරීමෙහි ලා දේශපාලන හා ආර්ථික වශයෙන් බලපෑම් සහගත රාජ්‍යයන් කිහිපයක් ආසියාව තුළ වේ. එනිසාම ජාත්‍යන්තර වශයෙන් ආසියාවෙහි වැදගත්කම වර්ධනය වෙමින් පවතී. ආසියානු භූ-දේශපාලනයෙහි සිදුවෙමින් පවතින මෙම වෙනස්කම්වලට ශ්‍රී ලංකාව සිය විදේශ ප්‍රතිපත්තිය මාධ්‍යයෙන් ප්‍රතිචාර දක්වමින් සිටී.

ඉන්දියානු සහ පැසිෆික් සාගරික දේශපාලනය

- ඉන්දියන් සාගරය නැගෙනහිර ආසියාව, මැද පෙරදිග සහ අප්‍රිකාව, යුරෝපය හා ඇමෙරිකාව සමඟ සම්බන්ධ කරන්නා වූ වැදගත් මුහුදු මාර්ග කිහිපයකට නිවස්න සපයයි. මෙම වැදගත්කම කලාපය තුළ උපායමාර්ගික, ආර්ථික සහ වෙළඳ වැඩ සටහන් ගණනාවක් සඳහා පෙළැඹුම් සාධකයක් වී ඇත. ආසියානු ජලයෙහි සිදුවෙමින් පවතින මේ සංවර්ධනයන් කෙරෙහි අවධානයෙන් සිටීමට ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති සම්පාදකයින්ට සිදු වී ඇත.

**ගෝලීය දේශපාලනය**

ජාත්‍යන්තර බල තුලනය

- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමෙහි ලා වර්තමාන බහු-ධ්‍රැව ලෝක බල තුලනය ඍජු බලපෑමක් කර තිබේ. ගෝලීය අවකාශය තුළ බල කේන්ද්‍ර ගණනාවක් ඉස්මතුව පවතින බැවින් (උදා:- ඇමෙරිකාව, යුරෝපා සංගමය, BRICS රාජ්‍යයන්, චීනය, ඉන්දියාව, රුසියාව) මෑත කාලීනව විදේශ ප්‍රතිපත්තිය කිසියම් සමතුලිත ස්වභාවයක් පෙන්නුම් කරයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

දෘෂ්ටිවාදීමය දේශපාලනය

- පශ්චාත් නිදහස් සමයෙහි මුල් දශක තුන තුළ ශ්‍රී ලංකාවෙහි විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන දෘෂ්ටිවාදීමය ස්ථාවරය වූයේ නොබැඳි පිළිවෙතයි. කෙසේ වෙතත්, පශ්චාත් නිරවි සංග්‍රාම කාලය තුළ දී පෙර පැවති ද්වි-ධ්‍රැව බල තුලනය බිඳවැටීමත් සමඟ නොබැඳි පිළිවෙතෙහි දේශපාලන තාර්කිකභාවය ප්‍රශ්න කෙරී තිබේ.

ජාත්‍යන්තර දේශපාලන ආර්ථිකය

- වර්තමාන ගෝලීය සන්දර්භය තුළ නව-ලිබරල්වාදී දේශපාලන හා ආර්ථික පරමාදර්ශ අණසක පතුරුවා ඇත. එනිසාම ඊට සමාන්තරව, ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික සබඳතා (Economic Diplomacy) ශ්‍රී ලංකාවේ මෑත කාලීන විදේශ ප්‍රතිපත්තියේ වඩාත් කැපී පෙනෙන දෘෂ්ටිවාදය බවට පත් වී තිබේ.

විකල්ප ජාත්‍යන්තර ව්‍යාපාර සහ සම්බන්ධතා ජාල

- වර්තමාන ගෝලීය පරිසරය තුළ ප්‍රධාන කර්තෘකයින්ට අමතරව, බලපෑම් සහගත විකල්ප ජාත්‍යන්තර ව්‍යාපාර සහ සම්බන්ධතා ජාල රාශියක් වර්ධනය වී ඇති ආකාරය දක ගත හැකියි. ත්‍රස්තවාදය, ආගමික මූලධර්මවාදය, කණ්ඩායම් අයිතිවාසිකම් සඳහා වන ව්‍යාපාර (උදා:- LGBT ව්‍යාපාර, ලෝක පරිමාණ කම්කරු ව්‍යාපාර - එනම් ප්‍රංශයේ Yellow Vest ව්‍යාපාරය වැනි), අධිකාරිවාදී පාලනයන් පළවා හැරීම පිණිස සංවිධානය වූ නව සමාජ ව්‍යාපාර මේ සඳහා නිදසුන් සපයයි. අභ්‍යන්තර මහජන මතය ඉහත සංවර්ධනයන් කෙරෙහි ඇතැම්විට ප්‍රතිරෝධී වුවද, එම සංවර්ධනයන්ට සාපේක්ෂව රාජ්‍යයේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීමට ශ්‍රී ලංකාවට සිදුවිය හැකිය.

**නිගමනය (උපරිම ලකුණු 03)**

- ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වඩාත් සම්බන්ධිත රටක් වශයෙන් හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකාව එකී ගෝලීය සම්බන්ධතා තුළ සිය පා සළකුණු සටහන් කරන මාධ්‍යය වන්නේ විදේශ ප්‍රතිපත්තියයි. සමකාලීන ජාත්‍යන්තර පරිසරයෙහි පවතින ගෝලීයකරණය වූ ස්වභාවය විසින්, විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දි ගෝලීය ප්‍රවනතා කෙරෙහි සංවේදී වීමට පොළඹවනු ලැබේ.
- විශේෂයෙන්, කුඩා රාජ්‍යයන් හී විදේශ ප්‍රතිපත්තිය සඳහා ලෝක දේශපාලනයෙහි අණසක පතුරුවා සිටින දෘෂ්ටිවාදී ස්ථාවරයන් බලපෑම් කරයි. මෙම යථාර්ථය ශ්‍රී ලංකාව කෙරෙහිද සාධාරණ වන අතර ලෝක පරිමාණ වේදිකාවන්වල ශ්‍රී ලංකාවේ නියෝජනයට එකී දෘෂ්ටිවාදීමය සාධක ද බලපායි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**10.** පහත සඳහන් ඕනෑම **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ජාතිකවාදය

(ii) නිරාගමිකවාදය

(iii) ගැටුම් කළමනාකරණය

(iv) "සිවිල් සමාජය" යන සංකල්පයේ අර්ථ

(v) බලය පිළිබඳ ස්ත්‍රීවාදී දැක්ම

(ලකුණු 20)

**10. i ජාතිකවාදය (ලකුණු 10)**

අභිමතාර්ථයඃ මෙම මාතෘකාවේ අරමුණ දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදය පිළිබඳවත්, දේශපාලනයේ තේමාවක් ලෙසත් එහි වැදගත්කම පිළිබඳවත් අපේක්ෂකයින් සතු අවබෝධය පරීක්ෂා කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

ජාතිකවාදය යනු නූතන ලෝකයේ රාජ්‍යය, දේශපාලන ආයතන, රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශපාලන අරගල සකස් කිරීමට අවශ්‍ය ඉදිරි දැක්ම ඉදිරිපත් කරන ප්‍රධාන පෙළේ මතවාදයක් බව පෙන්වා දීමෙන් මෙම පිළිතුර ආරම්භ කළ හැකිය. නූතන ජාතික රාජ්‍ය ක්‍රමය සඳහා අවශ්‍ය දැක්ම ඉදිරිපත් වන්නේ ද ජාතිකවාදයෙනි.

**සාකච්ඡාව (ලකුණු 06)**

- දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදය පළමුව වර්ධනය වූයේ 18 වැනි සියවසේ යුරෝපයේ ය. පසුව එය යුරෝපීය යටත් විජිත වලට පැතිරිණ.
- කෙටියෙන් අර්ථ නිර්ණය කළහොත්, ජාතිකවාදය යනු, නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක ජීවත් වන ජනතාවක් සංස්කෘතිකව හා දේශපාලන වශයෙන් ජාතිය යන ඒකකයෙන් සමන්විත වන්නේය යන අදහසයි. මතවාදයක් ලෙස එය ඉටු කරන කාර්යය නම් මානව ප්‍රජාවන්ට තමා 'ජාතියකට' අයත් වන්නේ ය යන විඥානය සපයා දීමයි.
- ජන ප්‍රජාවකට /ජාතියකට අයත් වන්නට නම් ඔවුන්ට බෙදා ගත හැකි අනන්‍යතා තිබිය යුතු බවද ජාතිකවාදය කියා සිටී. ඒ අනුව සංස්කෘතිය, භාෂාව, පොදු ආර්ථිකය, එකට ජීවත් වන භූමි ප්‍රදේශය හා උපන් බිම යනු 'ජාතික අනන්‍යතාවයේ මූලික සාධකයි.
- යුරෝපයේ 1789 ප්‍රංශ විප්ලවයෙන් පසුව නූතන ජාතික රාජ්‍ය ක්‍රමය බිහිවීමේ ක්‍රියාවලිය සිදු වූයේ ද ජාතියක් යනු රාජ්‍යයේ භූමි ප්‍රදේශය ඇතුළත ජීවත්වන සෑම පුරවැසියෙකුටම පොදු අනන්‍යතාවයකින් සහ සංස්කෘතියක් ඇති දේශපාලන ප්‍රජාවක්ය යන අදහසින් ලැබූ ආභාසයෙනි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදය පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.
  - i. එය ජාතික රාජ්‍යයක් ඇතුළත ජීවත්වන ජන ප්‍රජාවන්ට දේශපාලන ප්‍රජාවක් ලෙස පොදු අනන්‍යතාවක් ද තනි ප්‍රජාවක් වෙතට තමන් අයත් වන්නේය යන හැඟීමද ලබා දෙයි.
  - ii. පොදු අනන්‍යතාවන් සමඟ, දේශපාලන ක්‍රියාකාරීත්වය සඳහා ඉදිරි දැක්මක් ද මගපෙන්වීමක් ද ජාතිකවාදය ජනප්‍රජාවන්ට සපයා දී තිබේ. නිදසුනක් ලෙස යටත් විජිත ලෝකයේ ජනතාව 'නිදහස' සහ 'විමුක්තිය' ලබා ගැනීම සඳහා අරගල කළේ 'නිදහස් ජාතියක්' පිළිබඳව ජාතිකවාදය විසින් ලබා දෙනු ලැබූ අනුප්‍රාණය මතය.
  - iii. බහුවාර්ගික ජාතික රාජ්‍යවල ජීවත්වන කුඩා සහ සුළුතර වාර්ගික කණ්ඩායම්වල දේශපාලන මතවාදය හා ඉදිරි දැක්ම වන්නේ ද ජාතිකවාදයයි. 'ජාතිය' යන අදහස වෙතින් පණ ගන්වනු ලබන ඔවුහු තමන් ආන්තික කරනු ලැබූ සුළුජන ප්‍රජාවන් නොව, සමාන දේශපාලන හා අනෙක් අයිතිවාසිකම් වලට හිමිකම් කියන 'ජාතීන්' ද වන බව ප්‍රකාශ කරයි.
  - iv. නූතන ජාතික රාජ්‍යයේ පදනම් මූලධර්ම ගොඩනැගී තිබෙන්නේ ජාතිකවාදය මතය. ජාතික ස්වාධිපත්‍යය, ජාතික නිදහස, භෞමික ඒකාග්‍රතාව, සංස්කෘතික ඒකාග්‍රතාව සහ පුරවැසිභාවය යන මේවා හැඩගැසී ඇත්තේ ජාතිය පිළිබඳව නූතන මතවාද වලට අනුකූලවය.
  - v. ජාතිකවාදයේ එවැනි දේශපාලන භූමිකා වලට පහත සඳහන් තේමා අයත් වේ i. ජාතියේ සහ රාජ්‍යයේ මතවාදයක් ලෙස ii. තමන්ට ඇත්තේ පොදු දේශපාලන ඉරණමකි යන හැඟීම මත දේශපාලන ප්‍රජාවකට සාමාජිකයින්ට එකට සිටීමට දේශපාලන දැක්ම ලබා දීම iii. පොදු ජාතියකට අයත් වන්නේ යැයි සිතීමට අවශ්‍ය චින්තන රාමුව සැපයීම සහ iv. දේශපාලන ක්‍රියාකාරීත්වයට මග පෙන්වන දැක්මක් වීම. ජාතික සහ ලෝක දේශපාලනය තුළ ජාතිකවාදය ඉටු කරන භූමිකාව ගැන පැහැදිලි කිරීමක් නොමැතිව නූතන දේශපාලනය නිසි පරිදි තේරුම් ගැනීම වඩා දුෂ්කරය.

**නිගමනය (ලකුණු 02)**

ජාතිකවාදයේ අවසානයකට පත් වී නැති, නූතන දේශපාලනය තුළ ඉටු කරන බහුවිධ භූමිකාවන් ගැන සඳහන් කරමින් මෙම පිළිතුර අවසන් කළ හැකිය. ජාතිකවාදය දේශපාලනය තුළ ඉතා වැදගත් කාර්යයක් ඉටු කරමින් තිබෙන ලංකාවේ මෙය වඩාත් හොඳින් නිරීක්ෂණය කළ හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

### 10.ii නිරාගමිකවාදය (ලකුණු 10)

**අභිමතාර්ථය:**

මෙම මාතෘකාවෙන් අපේක්ෂා කරන්නේ ආගමෙහි දේශපාලන කාර්යය පිළිබඳවත්, ඒ ගැන නිරාගමිකවාදය විසින් ඉදිරිපත් කර ඇති දැක්මත් පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමයි. නිරාගමිකවාදය නම් සංකල්පයේ ආරම්භය, එහි ලිබරල්වාදී සහ සමාජවාදී සංකල්පගත කිරීම් මෙන්ම, එම සංකල්පය වර්ධනය කිරීමට සිදු වූ ඉන්දියානු දායකත්වය පිළිබඳවත් අපේක්ෂකයන් සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමද එයින් අදහස් කෙරේ.

**හැඳින්වීම (ලකුණු 02)**

සමකාලීන ලෝකයේ මෙන්ම ලංකාවේ ද 'ආගම' යන්න දේශපාලන තේමාවක් බව සඳහන් කරමින් පිළිතුරේ 'හැඳින්වීම' ආරම්භ කළ හැකිය. එමෙන්ම නිරාගමිකවාදය යනු ආගමට විරුද්ධ තර්කයක් නොවන බවත්, එම සංකල්පයේ කේන්ද්‍රීය අදහස වන්නේ ආගම සහ දේශපාලනය මිශ්‍ර කර නොගැනීම බවත් 'හැඳින්වීම' කොටසෙහි ද කිව හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- නිරාගමිකවාදය යන නව සංකල්පය ආරම්භ වූයේ 18 සහ 19 වැනි සියවස් වල යුරෝපයේ ය.
- නිරාගමිකවාදය යනු යුරෝපයේ ප්‍රබුද්ධ යුගයේ චින්තනයේ ම කොටසකි. එබැවින් එය ලිබරල්වාදය සහ සමාජවාදය යන දෘෂ්ටිවාද දෙකටම ආභාසය සපයා ඇත. එය පළමුවෙන් මතු වූයේ පල්ලිය සහ රාජ්‍යය අතර තිබූ 'අශුද්ධ සන්ධානය' ට එරෙහිව සටන් කළ බලවේග වල මතවාදයක් ලෙසය.
- යුරෝපයේ නිරාගමිකවාදී අදහස් මතු වීමට හේතු වූ තවත් මූලාශ්‍රයක් වූයේ පල්ලිය සමාජය මත පවත්වා ගෙන ආ බුද්ධිමය ආධිපත්‍යය පිළිබඳව මතු වූ විවේචනයයි.
- මෙම අදහස්වලින් නිරාගමිකවාදය පිළිබඳව ලිබරල්වාදී සහ සමාජවාදී චින්තන වලට අනුප්‍රාණය ලැබිණ. මෙම මතවාද දෙකම තර්ක කළේ පල්ලිය සහ රාජ්‍යය එකිනෙකින් වෙන් කළ යුතු බවයි.
- ලිබරල් නිරාගමිකවාදයේ මූලික මූලධර්ම
    i. රාජ්‍යය සහ පල්ලිය ආයතනික වශයෙන් වෙන් කිරීම.
    ii. රාජ්‍යය කිසිදු ආගමක් සමඟ අනන්‍ය විය යුතු නොවේ.
    iii. ආගම ඉගැන්වීම හෝ ප්‍රචාරය කිරීමට රාජ්‍යය සහභාගී විය යුතු නැත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

iv. රාජ්‍යය කිසිදු ආගමක් සමඟ සම්බන්ධ වීම, හෝ කිසිදු ආගමකට විරුද්ධ වීම නොකළ යුතු වේ.
v. ආගමික නිදහස පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකමක් විය යුතුය.
vi. ආගම පදනම් කරගෙන කිසිදු පුරවැසියෙකුට වෙනස්කම් නොකළ යුතුය.

- සමාජවාදී නිරාගමිකවාදයේ ප්‍රධාන මූලධර්ම
  i. රාජ්‍යය ආගමෙන් සම්පූර්ණයෙන් වෙනස් විය යුතුය.
  ii. ආගමට පැවතිය හැක්කේ රාජ්‍යයේ අවසරය ඇතිව පමණි.
  iii. ආගමික ආයතනවලට පවතින්නට හැකි වන්නේ ඒවා රාජ්‍යයට තර්ජනයක් නොවන තාක් දුරට සහ රාජ්‍යයේ අවසරය තිබෙන තාක් දුරට පමණි.
  iv. දේශපාලන හෝ පුරවැසි සංවිධාන ආගමික අනන්‍යතාව මත ගොඩ නොනැගිය යුතුය.
- ලිබරල් සහ සමාජවාදී නිරාගමිකවාද යුරෝපීය සම්භවයක් ඇති ඒවා ය. එබැවින් ඒවායින් ප්‍රකාශ වන්නේ යුරෝපයේ ඓතිහාසික අත්දැකීමයි. ඊට අමතරව, ලංකාවට ද වඩා අදාළ වන, නිරාගමිකවාදය පිළිබඳ ඉන්දියානු සම්ප්‍රදායක් තිබේ.
- නූතන ඉන්දියානු නිරාගමිකවාදය , බුද්ධාගම, හින්දු ආගම, ජෛන ආගම , ධර්මාශෝක රජතුමාගේ ඉගැන්වීම් මෙන්ම රාම ක්‍රිෂ්ණ පරමහංස සහ ස්වාමි විවේකානන්ද වැනි නූතන හින්දු චින්තකයන්ගේ ඉගැන්වීම් වලින් ද ආභාසය ලබා ඇත. එහි ප්‍රධාන චින්තකයන් වන්නේ මහත්මා ගාන්ධි, සර්වපල්ලි රාධක්‍රිෂ්ණන්, ජවහර්ලාල් නේරු සහ රාජේන්ද්‍ර ප්‍රසාද් යන දේශපාලන නායකයන් ය.
- ඉන්දියානු නිරාගමිකවාදයේ ප්‍රධාන ඉගැන්වීම් මෙසේය.
  i. ධර්ම නිරපේක්ෂතාව - රාජ්‍යය ආගමික වශයෙන් අපක්ෂපාත වීම.
  ii. සර්ව ධර්ම සමානාත්මතාව - සෑම ආගමකටම රාජ්‍යය සමසේ සැලකීම සහ සෑම ආගමක්ම සමාන යැයි පිළිගැනීම.
  iii. රාජ්‍යය ආගමික අනන්‍යතාවය නොසලකා, සෑම පුරවැසියෙකුටම සමසේ සැළකිය යුතුය.
  iv. පුරවැසිභාවය ලබා ගැනීමේදී ආගම බාධාවක් හෝ සුදුසුකමක් හෝ නොවිය යුතුය.

**නිගමනය (ලකුණු 02)**

නිගමනය කොටසේදී ඉහත දැක්වූ ප්‍රධාන සාකච්ඡාව සාරාංශ කළ හැකිය. එසේම, නිරාගමිකවාදය කර ඇත්තේ රාජ්‍යය සහ ආගම අතර ඇති සම්බන්ධය අපක්ෂපාතභාවය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ලෙස යලි නිර්වචනය කිරීම බවද කිව හැකිය. නිරාගමිකවාදය යනු ආගමික විරෝධී වීම නොවේ. ආගම සමාජයේ කටයුතු නොකළයුතු බව එයින් කියැවෙන්නේ නැත. එයින් අවධාරණය කෙරෙන්නේ, රාජ්‍යය ආගම් සම්බන්ධ අපක්ෂපාතීව සිටීම සහ කිසිදු වෙනස්කමක් කරනු ලබන්නේ නැතිව තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස පුරවැසියන්ට සහතික කිරීමයි. ආගම සහ දේශපාලනය එකිනෙකට වෙනස් ක්ෂේත්‍ර බවද එය අවධාරණය කරයි.

ඉන්දියානු නිරාගමිකවාදී සංකල්පය ලංකාවේ යථාර්ථයන්ට වඩාත් ගැළපෙන බව යෝජනා කරමින් පිළිතුර අවසන් කළ හැකිය.

**10.iii ගැටුම් කළමණාකරණය (ලකුණු 10)**

**අභිමතාර්ථය**

ගැටුම් කළමනාකරණයේ ක්‍රියාවලිය පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධයත්, ගැටුම් නිරාකරණය යන සංකල්පය පිළිබඳව වටහා ගැනීමත් පරීක්ෂා කිරීම මේ මාතෘකාවේ අරමුණයි.

**හැඳින්වීම (ලකුණු 02)**

ගැටුම් නිරාකරණය යනු සාමාන්‍යයෙන් දුෂ්කර, සංකීර්ණ සහ දීර්ඝ ක්‍රියාවලියකි. මේ බව පුද්ගලික මෙන්ම සමාජ ගැටුම් වලදී අපට නිරීක්ෂණය කළ හැකිය. ගැටුමක් සම්පූර්ණයෙන් විසඳීම දුෂ්කර වුවත්, ගැටුමකට නිර්මාණාත්මකව ප්‍රවේශ වීමේ සහ ගනුදෙනු කිරීමේ වෙනත් විධික්‍රම තිබේ. ගැටුම් උත්සන්න වීම සහ පාලනය කළ නොහැකි වීම වැළැක්වීමට ඇති එවැනි ප්‍රවේශයක් වන්නේ ''ගැටුම් කළමනාකරණය'' යි.

www.alevelapi.com

**සාකච්ඡාව (ලකුණු 06)**

- ගැටුම් සමථනය සඳහා ඇති සාධනීය ප්‍රවේශ කෙටියෙන් විස්තර කරමින්, සාකච්ඡාව ආරම්භ කළ හැකිය. ඒවා නම් :
  - i. ගැටුම් ගැන කල්තියා අනතුරු ඇඟවීම: එනම්, සමාජයේ ඇති වීමට ඉඩ තිබෙන ගැටුම් ගැන, ඒවා මතු වීමට පෙර හඳුනා ගැනීමයි. මතුවීමට ඇති ඉඩකඩ වැළැක්වීමට පියවර ගැනීමයි.
  - ii. ගැටුම් වැළැක්වීම; මෙයින් කෙරෙන්නේ, කල්තියා අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණ මාර්ගයක් ගැටුම් ඇතිවිය හැකි ස්ථාන හඳුනාගෙන, ඒවා මතුවීම වැළැක්වීමට පියවර ගැනීමට ඒ මගින් අවකාශය ලැබේ.
  - iii. ගැටුම් කළමනාකරණය: ගැටුමක් ඇති වූ පසු එය පැතිරීම වැළැක්වීමට පියවර ගැනීමයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

iv. ගැටුම් පරිවර්තනය: ගැටුමේ අරමුණු, පාර්ශව නීතිරීති, ව්‍යුහය, න්‍යායපත්‍ර යන මේවා පරිවර්තනය වීම තුළින් ගැටුම විසඳීමට හැකි වීම.

v. පශ්චාත් ගැටුම් සාමය ගොඩනැගීම: ගැටුම් ඒකපාක්ෂිකව හෝ සාම ගිවිසුමක් මගින් හෝ අවසානයට පත් වූ පසුව, එම ගැටුම යළි මතුවීම වැළැක්වීමට පියවර ගැනීමයි. එවැනි සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියකට සංහිඳියා ක්‍රියාමාර්ගත්, ගැටුමේ මුල හේතු වලට විසඳුම් සෙවීමත් අවශ්‍ය වේ.

- පිළිතුරේ ඊලග පියවර වන්නේ ගැටුම් කළමනාකරණය යන්න පැහැදිලි කිරීමයි. මෙය ගැටුම් කළමනාකරණයේ අරමුණු ගැටුම් විසඳීමේ අරමුණු සමග සැසඳීමෙන් කළ හැකිය.
- ගැටුම් කළමනාකරණය යන සංකල්පයේ අර්ථ දෙකක් තිබේ.

i. ගැටුම් විසඳීම දුෂ්කර සහ දීර්ඝ කාලීන ක්‍රියාවලියක් වන විට, එම ගැටුමේ තියුණුභාවය, එහි පැතිරීම සහ ප්‍රචණ්ඩ, බව සීමා කිරීම පළමු වැන්නයි. මේ මගින් ගැටුමේ මූල හේතු විසඳීම සහිතව ආමන්ත්‍රණය වන්නේ නැත. ගැටුම නිශේධනීය ප්‍රතිඵල ඇති කරන්නක් බව ද මේ ප්‍රවේශයෙන් පිළිගැනේ. කළ යුත්තේ ගැටුමේ නිශේධනීය ගතිකත්ව සහ පල විපාක පාලනය කිරීමයි.

ii. ගැටුම නිශේධනීය යැයි දෙවන ප්‍රවේශය පිළිනොගනී. එය ගැටුම දෙස සාධනීයව බලයි. එය සමාජයේ ඇත්තටම පවතින දුක් ගැනවිලි සහ අසාධාරණතාවල ප්‍රතිඵලයක් ලෙස දකියි. විසඳුම් දිය යුත්තේ එම දුක් ගැනවිලිවලටය. ඒ මගින් යෝජනා වන්නේ, සාකච්ඡා, සහමන්ත්‍රණ, සංවාද සහ අවසානයේදී සාමගිවිසුමක් කරා ගැටුමේ ගමන් මග යළි දිශා ගත කිරීමයි.

- මේ ප්‍රවේශ දෙකෙන්ම කෙරෙන්නේ ගැටුමක් විනාශකාරි, ප්‍රචන්ඩකාරි ලෙස වර්ධනය වී අර්බුදයක් නිර්මාණය කරන තත්ත්වයට පත් වීම වැළැක්වීමේ සාධනීය පියවර ගැනීමයි.
- ගැටුම් කළමනාකරණය, ගැටුම් නිරාකරණය/ විසඳීම සමග සසඳනවිට අපට පෙනෙන්නේ, ගැටුම් නිරාකරණයට ඇත්තේ සීමිත න්‍යාය පත්‍රයක් සහ සීමිත අරමුණය යන්නයි. ගැටුම් විසඳීමට නම් ගැටුමේ මූල හේතු සොයා ඒවාට විසඳුම් ලබා දීය යුතුය; ගැටුම නැවත ඇතිවීම ද වැළැක්විය යුතුය, ඒ සඳහා තිබිය යුත්තේ පුළුල් න්‍යාය පත්‍රයකි. ඒ සඳහා දීර්ඝ කාලීන පශ්චාත් ගැටුම් සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියක් ද අවශ්‍යය. ගැටුම් කළමනාකරණය ගැටුමක් තියුණු වන තෙක් බලා සිටින්නේ ද නැත. එය කරන්නේ සමකාමි සහ ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගවලින් ගැටුම උත්සන්න වීම වැළැක්වීමයි.

**නිගමනය (ලකුණු 02)**

ඉහත සාකච්ඡාව කෙටියෙන් සාරංශ කරමින්, නිගමනය ආරම්භ කළ හැකිය. ගැටුම් කළමනාකරණයෙන් යෝජනා කරන්නේ පුද්ගලික සහ සමාජ ගැටුම් විසඳීමේ වියදම් අඩු ප්‍රවේශයක් බව ද කිව හැකිය. ගැටුමක් තියුණු වීමට ඉඩ හැරියොත්, එය කළමනාකරණය කිරීම දුෂ්කරය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 10.iv සිවිල් සමජය යන සංකල්පයේ අර්ථ (ලකුණු 10)

### අභිමතාර්ථය

**"සිවිල් සමාජය"** යන සංකල්පයේ න්‍යායික පදනම් ගැන අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම මාතෘකාවේ අරමුණයි.

### හැඳින්වීම (ලකුණු 02)

"සිවිල් සමාජය" යනු, පුරවැසියන් සිය සාමූහික අභිලාෂ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට එකට ක්‍රියා කරන සමාජ අවකාශ යැයි අර්ථ විග්‍රහයක් දැක්වීමෙන් පිළිතුර ආරම්භ කළ හැකිය. පුරවැසියන් සිවිල් සමාජ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වීම නූතන දේශපාලනයේ අංගයක් බව ද දැක්විය හැකිය. එය ප්‍රජාතන්ත්‍රවාදය නූතන න්‍යායයේ වැදගත් සංකල්පයක් ද වෙයි.

### සාකච්ඡාව (ලකුණු 06)

"සිවිල් සමාජය" යන්නෙහි සංකල්පමය ඉතිහාසය තුළ එහි අර්ථ 04 ක් ඉදිරිපත් වී තිබේ. ඒවා නම් සම්භාව්‍ය ලිබරල්, සම්භාව්‍ය මාක්ස්වාදී, සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී සහ නව මාක්ස් වාදී ග්‍රාම්ෂියානු යන අර්ථයි.

i. සම්භාව්‍ය ලිබරල් අර්ථය: සිවිල් සමාජය යනු රාජ්‍ය සහ පවුල අතර ඇති සමාජ අවකාශයයි. ඉම්මානුවෙල් කාන්ට් සහ හේගල් යන දාර්ශනිකයෝ මෙම අර්ථ ඉදිරිපත් කළ චින්තකයන්ය. හේගල් වැඩිදුරටත් කියා සිටියේ සිවිල් සමාජය යනු ධනවාදී වෙළෙඳපොළ බව සහ එය පුද්ගල නිදහස සාක්ෂාත් කර ගැනීමේ අවකාශය වන බවයි.

ii. සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය: මේ අර්ථය වර්ධනය කළ කාල් මාක්ස් යොදාගත්තේ සිවිල් සමාජය යනු ධනවාදී වෙළෙඳපොළ යැයි හේගල් ඉදරිපත් කළ අර්ථයයි. ඒ සමඟම ඔහු එම අර්ථය දැඩි විවේචනයට ලක් කරමින් කියා සිටියේ සිවිල් සාමජය යනු පුද්ගල නිදහසේ ක්ෂේත්‍රය නම් නොව බවයි. මාක්ස් ධනවාදයේත්, ධනවාදී වෙළපොළේත් දැඩි විවේචකයෙකු විය. මාක්ස් කියූ පරිදි ධනවාදී වෙළෙඳපොල යනු මිනිසුන්ගේ ආත්මාර්ථකාමී අභිලාෂ වෙළෙළපොල තරඟය තුළින් ඉටුකරගන්නා අඩවියයි. එබැවින් සිවිල් සමාජයේදී සිදුවන්නේ පුද්ගලයින් තම මානව ශක්‍යතා ඉටු කර ගැනීමට නොහැකි හුදෙකලා අසරණ පුද්ගලයින් බවට පත් වීමයි.

iii. සිවිල් සමාජය සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජ අවකාශය ලෙස: මේ අර්ථ කථනයට අනුව සිවිල් සමාජය යනු පුරවැසියන් තම සාමූහික අවශ්‍යතා ඉටු කර



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ගැනීම පිණිසත් ආණ්ඩුවෙන් ස්වාධීනව සමිති සමාගම් පිහිටුවාගෙන ඒ තුළින් එම අභිලාෂ සහ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ඇති සමාජ අවකාශයයි. මෙහිදී පුරවැසියෝ විවිධ ස්වේච්ඡා සමාගම් පිහිටුවා ගනිති. මේ අදහස මුලින්ම ගොඩ නැගුවේ ප්‍රංශ දේශපාලන චින්තයෙකු වූ ඇලෙක්සි ද තොක්විල්ය.

iv. නව මාක්ස්වාදී ග්‍රාම්ෂියානු අර්ථය: ඉතාලියානු මාක්ස්වාදීයෙකු වූ අන්තෝනියෝ ග්‍රාම්ෂි 1930 ගණන්වලදී ගොඩනැගූ නව අර්ථකථනයට අනුව සිවිල් සමාජය යනු පුරවැසියන් තම සංස්කෘතික සහ සමාජයීය කටයුතු කර ගෙන යන රාජ්‍යයේ මැදිහත්වීමෙන් ස්වාධීනව පවතින, සමාජීය අවකාශයයි. පාලක පන්තීන් තම දේශපාලන ආධිපත්‍යය පිහිටුවීමේදී මෙම සිවිල් සමාජ ක්ෂේත්‍රයේද ආධිපත්‍යය පිහිටුවති. ඔවුන් තම පාලන ක්‍රමයට මහජන කැමැත්ත ගන්නේ ඒ මගිනි. ආගම, සංස්කෘතිය අධ්‍යාපනය යනු පාලක පන්තින් එලෙස තම නායකත්වය පිහිටුවන සිවිල් සමාජ අවකාශයයි. පාසැල්, වෘත්තීය සමිති, ක්‍රිඩා සමිති සංවිධාන, ජනමාධ්‍ය සංස්කෘතික සංවිධාන යන මේවා සිවිල් සමාජයේ අංගයයි.

- සිවිල් සමාජය යන සංකල්පයට වඩාත් නූතන අර්ථයක් ද තිබේ. ඒ අනුව සිවිල් සමාජය යනු පුරවැසියන් රාජ්‍යයෙන් සහ ආණ්ඩුවෙන් ස්වාධීනව තම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාකාරීත්වයේ යෙදෙන සමාජ අවකාශයයි. ඕනෑම සමාජයක වෘත්තීය සමිති, කම්කරුවන්, ගොවි ජනතාව, ශිෂ්‍ය කණ්ඩායම් සහ පුරවැසියන් සමාජ ව්‍යාපාර විරෝධතා සහ උද්ඝෝෂණ වල යෙදෙති. ඒ මගින් දේශපාලන පක්ෂවලින් ස්වාධීනව සංවිධානය වී ආණ්ඩුවට තම ඉල්ලීම් ඉදිරිපත් කරති. මේ පරිදි සිවිල් සමාජය යන්න අර්ථ විග්‍රහ කර තිබෙන්නේ පුරවැසි ස්වායත්තතාව සඳහා රාජ්‍යයෙන් ස්වාධීන තිබෙන සමාජ අවකාශය ලෙසයි.
- සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය ප්‍රජාත්‍රන්ත්‍රවාදී දේශපාලන ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙසද දූන් සැළකේ. වර්තමාන දේශපාලන න්‍යායයේ එම පුරවැසි සමාජ ක්‍රියාකාරීත්වය හැඳින්වෙන්නේ "සිවිල් සමාජ දේශපාලනය" ලෙසයි.

**නිගමනය (ලකුණු 02 )**

ඉහත සාකච්ඡාව සාරාංශ කරමින් පිළිතුරු අවසන් කළ හැකිය. සිවිල් සමාජය යන සංකල්පයේ අර්ථය විවිධ ඓතිහාසික පසුබිම් තුළ විකාශනය වී ඇති බව ද එහිදී පෙන්වා දිය හැකිය. එමෙන්ම එය නූතන දේශපාලන න්‍යායේ ප්‍රධාන සංකල්පයක් ලෙස ද ප්‍රජාත්‍රන්තවාදී දේශපාලන ක්‍රියාකාරීත්වයේ අවකාශය ලෙසද සැළකෙන බව ප්‍රකාශ කළ හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 10. v බලය පිළිබඳ ස්ත්‍රීවාදී අදහස (ලකුණු 10)

### අරමුණ

මෙම ප්‍රශ්නයේ පරමාර්ථය වන්නේ බලය පිළිබඳ ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණය සහ බලය පිළිබඳ දේශපාලනය විශ්ලේෂණය පුළුල් කිරීම සඳහා සිදුවූ ස්ත්‍රීවාදී දායකත්වය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය තක්සේරු කිරීමයි. ස්ත්‍රීවාදී දේශපාලන න්‍යායේ මූලික කරුණු පිළිබඳව ඔවුන්ගේ දැනුම ද තක්සේරු කෙරේ.

### හැඳින්වීම (ලකුණු 02)

- ස්ත්‍රීවාදී න්‍යාය දේශපාලන විද්‍යාවේ බලය න්‍යායගත කිරීමේ සාම්ප්‍රදායික ප්‍රවේශයන් විවේචනය කළ අතර, බලය හා මානව සමාජයේ එහි භාවිතාව පිළිබඳ නව පර්යාවලෝකයක් හඳුන්වා දුන්නේය.
- ස්ත්‍රීවාදී දේශපාලන න්‍යාය තර්ක කරන්නේ බලය සංකල්පගත කිරීම සහ ආයතනිකකරණය යන දෙකම පුරුෂ කේන්ද්‍රීය දෘෂ්ටිකෝණයකින් ව්‍යුහගත කර ඇති බවයි. මේ අනුව, ස්ත්‍රීවාදය ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රවේශයකින් (gender approach) බලය පිළිබඳ විග්‍රහ කිරීමක් යෝජනා කරයි.
- මෙම පිළිතුර මගින් අපේක්ෂකයින් බලය පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රවේශයේ මූලික අංග පිළිබඳව දැනුවත්ව බව පෙන්නුම් කළ යුතුය. බලය පිළිබඳ ස්ත්‍රීවාදී න්‍යාය දේශපාලනය පිළිබඳ ස්ත්‍රීවාදී න්‍යාය සමග සම්බන්ධ වී ඇති බව ද හඳුනාගත යුතු වේ.

### සාකච්ඡාව (ලකුණු 06)

- ස්ත්‍රීවාදී න්‍යායේ බලය පිළිබඳ අදහස් ඒකමතික බවකින් යුක්ත නොවේ. එම අදහස් ස්ත්‍රීවාදයේ විවිධ ධාරාවන් හි, එකිනෙකින් වෙනස් දෘෂ්ටිවාදාත්මක ස්ථාවරයන් මත ඉදිරිපත් වී ඇත. බලය පිළිබඳ ස්ත්‍රීවාදී විවේචනයේ වැදගත්ම දායකත්වය වන්නේ පුද්ගලික ක්ෂේත්‍රය/ පෞද්ගලික පරිමණ්ඩලය (private sphere) තුළ වන බලය පුළුල් අර්ථයකින් විශ්ලේෂණය කිරීමයි.
- ලිබරල් ස්ත්‍රීවාදීන් පොදුවේ බලය ධනාත්මක දෘෂ්ටියකින් විග්‍රහ කර ඇත. සමහර ලිබරල් ස්ත්‍රීවාදීන් බලය දේවල් අත්කරගැනීමේ මාධ්‍යයක් ලෙස දකින අතර, කාන්තාවන්ට පුරුෂයින්ට සමාන බලයක් ලැබෙන පරිදි බලය නැවත බෙදාහැරිය යුතු යැයි යෝජනා කරති.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- රැඩිකල් ස්ත්‍රීවාදීහු ස්වාමියා සහ දාසයා අතර සම්බන්ධතාවයේ දී මෙන් ආධිපත්‍යය සහ යටහත් භාවය අනුව බලය තේරුම් ගැනීමට නැඹුරු වෙති. එමෙන්ම ඔව්හු ස්ත්‍රීත්වය (femininity) සහ පුරුෂත්වය (masculinity) අතර වෙනස පිලිබඳ පුරුෂ මූලික ස්ථාපිතය නිදහස සහ යටහත් බව අතර දේශපාලන වෙනසම බව කියා සිටිති.
- සමාජවාදී ස්ත්‍රීවාදීන් තර්ක කර ඇත්තේ බලය සහ ආධිපත්‍යය සාම්ප්‍රදායිකව පුරුෂාධිපත්‍යය හා බැඳී ඇති බවයි. බලය, සමාජීය ආධිපත්‍යය එනම් පාලක පන්තියේ සහ පුරුෂයින්ගේ තත්ත්වයක් පමණක් ලෙස අනුව වටහාගෙන ඇත. එබැවින් ස්ත්‍රීවාදයේ කර්තව්‍යය වන්නේ බලය ස්ත්‍රීවාදී දෘෂ්ටි කෝණයකින් නැවත සංකල්පගත කිරීමයි. බලය පිලිබඳ මෙම ස්ථාවරය කාන්තාවන්ගේ ජීවන අත්දැකීම්, විශේෂයෙන් ප්‍රජනනය තුළ ඔවුන්ගේ භූමිකාව, මත පදනම් වියයුතු බව මෙහිදී යෝජනා කෙරේ.
- ස්ත්‍රීවාදීන් බලය දේශපාලනයේ කේන්ද්‍රීය සංකල්පයක් ලෙස සලකන නමුත් ඔවුන්ගේ විශේෂ අවධානය පුරුෂ ආධිපත්‍යය සහිත සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ආයතන හා භාවිතයන් තුළ කාන්තාවට දී ඇති අසමාන සහ යටහත් භූමිකාව තුළ බලය පවතින්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම කෙරෙහි යොමු කර ඇත.
- දේශපාලන විශ්ලේෂණය සඳහා ස්ත්‍රීවාදීන්ගේ ප්‍රධානතම දායකත්වයක් වන්නේ බලය පොදු පරිමණ්ඩලය තුළ පමණක් නොව පෞද්ගලික පරිමණ්ඩලයේ ද ක්‍රියාත්මක වන්නක් බව විග්‍රහ කිරීමයි. "පෞද්ගලිකත්වයම දේශපාලනිකයි" (personal is political) යනු ඔවුන් ඒ පිලිබඳ කළ විග්‍රහයේ ජනප්‍රියම ප්‍රකාශනය වේ.
- ඉහත ප්‍රකාශනය පෞද්ගලික පරිමණ්ඩලය තුළ, විශේෂයෙන් පවුල සහ පුද්ගලාන්තර සබඳතා තුළ, බලය සහ දේශපාලනය ගැබ් වී ඇති ආකාරය පැහැදිලි කරයි.
- ග්‍රීක දේශපාලන චින්තනයේ සිටම සාම්ප්‍රදායික දේශපාලන විද්‍යාව උපකල්පනය කළේ දේශපාලනය පවතින්නේ පවුලට පිටින් පවතින පොදු පරිමණ්ඩලය තුළ පමණක් බවය. ස්ත්‍රීවාදීන් මෙය අභියෝගයට ලක් කළ අතර පෞද්ගලික පරිමණ්ඩලයේ දේශපාලනය ප්‍රධාන ආකාර දෙකකින් සිදුවන බව පෙන්නුම් කළහ.

(i) රාජ්‍යය හා රාජ්‍ය ප්‍රතිපත්ති මෙන්ම නීතිය මගින් පවුල් සබඳතා, කාන්තාවන්ගේ ශරීරය, විවාහය සහ කාන්තාවන්ගේ සහ දරුවන්ගේ දේපළ අයිතිවාසිකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම. මේ අනුව පුද්ගලික පරිමණ්ඩලය රාජ්‍ය පාලනයෙන් තොර නොවේ;

(ii) පවුල තුළද ආධිපත්‍යයේ සහ යටත්වීමේ බල සම්බන්ධතා විසින් මනුෂ්‍ය සම්බන්ධතා නිශ්චය කරන ලද ස්ත්‍රී- පුරුෂ සබඳතාවක් පවතී.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 02)**

බලය පිළිබඳ ස්ත්‍රීවාදී ප්‍රවේශය, දේශපාලනය පිළිබඳ ස්ත්‍රීවාදී න්‍යායට සමීපව බැඳී ඇත. ස්ත්‍රීවාදයේ විවිධ ධාරාවන් තුළ සංවර්ධනය වූ බලය සහ දේශපාලනය පිලිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් වූ අර්ථ විග්‍රහය විසින් බලය සහ දේශපාලනය පිලිබඳ සාම්ප්‍රදායික දේශපාලන විද්‍යා ප්‍රවේශය රැඩිකල් වෙනසකට ලක් කර ඇත.

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .